# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 2,493 - 2026 ජුනි මස 12 සිකුරාදා - 2026.06.12**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස (II අ) වැනි කොටස - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)

| | පිටුව | | පිටුව |
|---|---|---|---|
| තනතුරු ඇබෑර්තු ... ... | - | විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... ... ... | - |

**සතිපතා නිකුත් වන *ගැසට්* පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

## වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකිරීම සඳහා දැන්වීම් භාර ගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතුය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට **තෙමසකට** පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2026 ජූලි මස 03 දින පළකෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2026 ජුනි මස 19 දින දහවල් 12.00 ට හෝ ඊට පෙර තැපැලෙන් හෝ ගෙනැවිත් රජයේ මුද්‍රණාලයට භාර දිය යුතුය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් *ගැසට් පත්‍රයේ* පළකළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන *ගැසට් පත්‍රයක* පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතුය."

**ප්‍රසන්න ජයරත්න,**
රජයේ මුද්‍රණාලයාධිපති

2026 අප්‍රේල් මස 02 දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

0000 - B 82800 - (2026/06)
E - 01

## ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට්* පත්‍රයෙහි පළ කරනු ලබන රාජ්‍ය සේවා පත් කිරීම්වලට අදාළ වන පොදු කොන්දේසි

1.1 තමා ශ්‍රී ලාංකිකයෙකු බවට ප්‍රමාණවත් සාක්ෂි සෑම අයදුම්කරුවකු විසින් ම ඉදිරිපත් කළ යුතුය.

ශ්‍රී ලාංකික යනුවෙන් අදහස් කෙරෙනුයේ ලංකා පුරවැසි පනතේ අර්ථ දක්වා ඇති පරිදි පාරම්පරික වශයෙන් හෝ ලියාපදිංචි කරවා ගැනීමෙන් හෝ ශ්‍රී ලංකාවේ පුරවැසිකම් ලැබූවෙකි.

1.2 ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන හෝ ඊට වඩා උසස් විභාගයකින් සමත් වී තිබීම අවම අධ්‍යාපනික සුදුසුකමක් වශයෙන් නියම කොට ඇති යම් තනතුරක් සඳහා ඉල්ලුම් කරන අයදුම්කරුවෙකු සිංහල හෝ දෙමළ හෝ මාධ්‍යයෙන් අධ්‍යාපනය ලැබූ අයෙකු වේ නම්, ඔහු ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන විභාගයකින් හෝ සිංහල හෝ දෙමළ හෝ භාෂාව විෂයයෙන් අවස්ථාවෝචිත පරිදි සමත් වී සිටිය යුතු ය. (1961 ජනවාරි මස 01 වැනි දිනට පෙර දිනක සිට රාජ්‍ය සේවයෙහි යෙදී සිටින්නාවූත් රාජ්‍ය සේවයෙහි වෙනත් තනතුරුවලට ඉල්ලුම් කරන්නාවූත් නිලධාරීන් විෂයයෙහි මෙම නියමය අදාළ නොවන්නේ ය.)

*1.3 අයදුම් කරනු ලබන තනතුර සඳහා නියමිත ඉහළම රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණවලින් නිදහස් කිරීමට හිමිකම් ලබන සුදුසුකම් පසු කලක දී ලබා තිබේ නම් මිස, නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණය සමත්වීමට අපොහොසත්වීම නිසා පරිවාස/පරීක්ෂණ කාලයකට යටත්ව දෙන ලද සිය පත්වීම අවසන් කරනු ලැබූ, සිංහල හෝ දෙමළ හෝ නොවන භාෂා මාධ්‍යයකින් රජයේ සේවයට ඇතුළත්ව සිටි නව ප්‍රවේශක නිලධාරීන්ගෙන් ලැබෙන අයදුම්පත් භාරගනු නොලැබේ.

2. සේවා කොන්දේසි - සාමාන්‍ය :

2.1 රාජ්‍ය සේවයෙහි යෙදී සිටින සියලු ම නිලධාරීහු මුදල් රෙගුලාසි, ආයතන සංග්‍රහය, දෙපාර්තමේන්තු නියෝග හෝ රෙගුලාසි සහ රජය විසින් වරින් වර නිකුත් කරනු ලැබිය හැකි වෙනත් නියෝග හෝ රෙගුලාසිවලට යටත් විය යුත්තා හ.

2.2 අදාළ අමාත්‍යාංශයෙහි ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි ප්‍රමාණයේ මුදලක් එම ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි අන්දමකින් ඇප තබන ලද රාජ්‍ය සේවා නිලධාරීන්ගේ (ඇප) ආඥාපනත යටතේ රාජ්‍ය නිලධාරියකුට නියම කරනු ලැබිය හැකි ය.

2.3 දිවයිනේ ඕනෑ ම තැනක සේවය කිරීමට රාජ්‍ය නිලධාරියෙකුට නියම කරනු ලැබිය හැකිය.

3. ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරීන්ට අදාළ සේවා කොන්දේසි

3.1 ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරිහු පූර්වෝක්ත 2 වැනි වගන්තියේ සඳහන් කොන්දේසිවලට අතිරේක වශයෙන් පහත දැක්වෙන අනිකුත් කොන්දේසිවලට ද යටත් විය යුතුය.

3.1.1 යම්කිසි තනතුරක පරිවාස කාලය අවුරුදු තුනකට වැඩි විය යුතු යැයි සලකනු ලබන්නේ නම් විනා එසේ නොමැති නම් සියලු ම පත් කිරීම් අවුරුදු තුනක පරිවාස කාලයකට යටත් වනු ඇත. පරිවාස කාලය තුළ හේතුවක් නොදක්වා සේවය නතර කරනු ලැබිය හැකිය.

3.1.2 සියලු ම රාජ්‍ය නිලධාරීහු රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියෙහි අවශ්‍යතාවයන් සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ෂඪ වන පරිච්ඡේදයේ විධිවිධාන සහ රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා දැනට පවත්නා වූ සහ මින් මතු පනවනු ලබන්නාවූ අනෙකුත් නීති, රෙගුලාසි සහ ව්‍යවස්ථා ද පිළිපැදිය යුත්තාහ.

3.1.3 රාජ්‍ය භාෂාවකින් වැඩ කිරීමට හැකිවන අන්දමේ දැනුමක් තමන්ගේ පරිවාස කාලය ඇතුළත ලබාගන්නා ලෙස සිංහල හෝ දෙමළ නොවන භාෂා මාධ්‍යයකින් රාජ්‍ය සේවයට ඇතුළත් වූ නිලධාරීන්ට නියම කෙරේ.

3.1.4 සිංහල හෝ දෙමළ හෝ නොවන වෙනත් භාෂා මාධ්‍යයකින් සේවයට ඇතුළත් වූ නිලධාරියෙකු පරිවාස කාලය අවසානයේ දී තනතුරෙහි ස්ථිර කරනු ලැබීමට අදාළ වන වෙනත් කරුණු අතර, අවුරුද්දක් ඇතුළත කවර හෝ රාජ්‍ය භාෂාවකින් නියමිත ප්‍රවීණතා පරීක්ෂණයෙහි I වැනි ශ්‍රේණියෙන් සමත්වීමත්, අවුරුදු දෙකක් ඇතුළත II වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් (අවශ්‍යනම්) අවුරුදු තුනක් ඇතුළත III වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් බලපවත්වනු ඇත.

නියමිත කාල සීමා ඇතුළත දී පරීක්ෂණයකින් අසමත් වුවහොත් වැටුප් වර්ධකයක් තාවකාලිකව අත්හිටුවනු ලැබිය හැකි ය. නියමිත කාලසීමාව ඉක්මවා තව මාස හයක කාලසීමාවක් ඇතුළත යථෝක්ත පරීක්ෂණයෙන් සමත්වීමට අසමත් වුවහොත් එසේ වැටුප් වර්ධක තාවකාලිකව අත්හිටුවීම, වැටුප් වර්ධක නතර කිරීමකට පරිවර්තනය කෙරෙනු ඇත. පරීක්ෂණයෙන් සමත්වන තෙක් හෝ පහත දැක්වෙන 3.1.6 වැනි වගන්තියේ විධිවිධානයන් බලපවත්වන තෙක් හෝ යථෝක්ත වැටුප් වර්ධකයන් නතර කිරීම ක්‍රියාත්මක වන්නේය.

3.1.5 මෙවැනි නිලධාරීන්ට පත්වීම ලැබීමෙන් පසු රාජ්‍ය භාෂාවක ප්‍රවීණතාවය ලබා ගැනීම පිණිස මාස හයක කාලයක් සඳහා පූර්ණ වැටුප් සහිත පහසුකම් සැලසිය යුතුය. ඉන් අනතුරුව අදාළ ප්‍රවීණතා විභාගයට ඔහු පෙනී සිටිය යුතු අතර, එම විභාගයෙන් අසමත් වුවහොත් පූර්ණ වැටුප් සහිත මාස හයක කාල පරිච්ඡේදයෙන් පසු ඒ සමඟම එළඹෙන අවුරුදු දෙකක කාල පරිච්ඡේදය තුළ තමාගේ සාමාන්‍ය රාජකාරිවල නිරත වෙමින් සිටිය දී විභාගයෙන් සමත්වීමට ඔහුට අවස්ථාව සලසා දෙනු ලැබේ.

3.1.6 නියමිත අවුරුදු දෙකහමාරක කාල පරිච්ඡේදය තුළ විභාගයෙන් සමත්වීමට නොහැකි වුවහොත් ඔහුගේ සේවය අවසන් කරනු ලැබේ.

3.1.7 රාජ්‍ය සේවයෙහි ස්ථිර තනතුරක දැනටමත් ස්ථිර කරනු ලැබ සිටින රාජ්‍ය නිලධාරියෙකු රාජ්‍ය සේවයෙහි වෙනත් ස්ථිර තනතුරකට පත් කරනු ලැබූ විට යළි පරිවාස කාලසීමාවක් සේවය කරන ලෙස සාමාන්‍යයෙන් ඔහුට නියම කරනු නොලැබේ. එවැනි නිලධාරියෙකු සිය නව තනතුරෙහි කරන සේවය පරීක්ෂා කර බැලීම සඳහා ප්‍රථමයෙන් එම තනතුරෙහි නියමිත කාලසීමාවක් වැඩ බැලීම සඳහා ඔහු පත් කරනු ලැබිය හැකි ය.

3.1.8 (රාජ්‍ය සේවයෙහි දැනටමත් ස්ථිර/තාවකාලික තනතුරු දරන්නා වූ ද වෛද්‍ය පරීක්ෂණයකට භාජනය කරනු ලැබුවා වූ ද, අය හැර) තෝරාගනු ලැබූ අපේක්ෂකයන් දිවයිනේ ඕනෑම පෙදෙසක සේවය කිරීමට ශාරීරිකව සුදුසුද නැද්ද යනු පරීක්ෂා කිරීම පිණිස රජයේ වෛද්‍ය නිලධාරියෙකු විසින් පවත්වනු ලබන වෛද්‍ය පරීක්ෂණයකට ඉදිරිපත්වන ලෙස ඔවුනට නියම කරනු ඇත.

4. සේවයට භාර ගැනීම පිළිබඳ කොන්දේසි

4.1 ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට පත් කරනු ලබන රාජ්‍ය නිලධාරීන් විසින් ඔවුන්ගේ වැටුපෙන් අයකර ගතයුතු යැයි රජය විසින් නියම කරනු ලබන ප්‍රතිශතයක ප්‍රමාණයට සමාන මුදලක් ස්වකීය වැටුපෙන් වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් වශයෙන් ගෙවිය යුතුය.

4.2 අර්ථසාධක අරමුදල් පදනම මත ස්ථිර හෝ තාවකාලික තනතුරුවලට පත්කරනු ලැබූ රාජ්‍ය නිලධාරීන් ස්වකීය ඒකාබද්ධ වැටුපෙන් 6%ක් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට දායක මුදල් වශයෙන් ගෙවිය යුතු වන්නේ ය. මුදල් වර්ෂය අවසානයේ දී අනිවාර්ය දායක මුදල් වශයෙන් අරමුදලට බැරකර ඇති මුදල් ප්‍රමාණය මෙන් 150%ක මුදල් ප්‍රමාණයක් රජය විසින් එම අරමුදලට රජයේ දායක මුදල වශයෙන් ගෙවනු ඇත.

4.3 පළාත් පාලන සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලබන රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරු උසුලන්නා වූ නිලධාරීන් සහ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබ පළාත් පාලන සේවයේ (විශ්‍රාම වැටුප් සහිත) තනතුරු උසුලන්නා වූ නිලධාරීන්හට පිළිවෙලින් ඔවුන්ගේ පළාත් පාලන සේවයේ සහ රාජ්‍ය සේවයේ තනතුරු සහ විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ.

4.4 විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය යටතේ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබූ යුද, නාවික සහ ගුවන් හමුදාවේ නිත්‍ය සේවයෙහි නියුතු පිරිසට ඔවුන්ගේ රාජ්‍ය සේවයෙහි තනතුරු සඳහා විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ. මෙම ව්‍යවස්ථා සංග්‍රහය යටතේ විශ්‍රාම වැටුප් සහිත බවට ප්‍රකාශිත තනතුරක රාජ්‍ය නිලධාරියෙක් ලෙස පත්වීමක් භාර ගැනීම සඳහා මුදා හරිණු ලැබූ සන්නද්ධ හමුදාවක යම් සාමාජිකයෙකුගේ සම්පූර්ණ වැටුප් සහිත අහිමි නොවූ සේවා කාලසීමාව මේ ව්‍යවස්ථා සංග්‍රහයේ පටහැනිව කුමක් සඳහන්ව තිබුණ ද, මේ ව්‍යවස්ථා සංග්‍රහය යටතේ ගෙවිය යුතු යම් විශ්‍රාම වැටුප් පාරිතෝෂිකයක කාර්යය සඳහා ගණන් ගත යුතු ය.

5. යුද්ධ සේවා අනුග්‍රහය

5.1 එක්සත් රාජ්‍ය යුද්ධාවතීරණ හමුදාවන්හි සේවා මුක්ත භටයින් ද, සහාය ගිනි නිවන, ගගන ප්‍රහාර නිවාරණ සහ මහජන ආරක්ෂක සේවාවන්හි පූර්ණකාලීන සාමාජිකයන් වශයෙන් නියුක්තව සිටි තමන්ගේම ඕනෑකමින් එම සේවාවන්ගෙන් අස්ව නොගිය අයට ද ඉහත කී සියලු සුදුසුකම් තිබේ නම් ද ඔවුන් මෙම හමුදාවන්ට බැඳී ඇත්තේ 1954 අගෝස්තු මස 15 වැනි දිනට පෙරාතුව නම් ද, ඔවුන්ගේ එම සේවාවන් සතුටුදායක ලෙස සහ අඛණ්ඩව පැවතිණි නම් ද, වයස අතින් සුදුසුකම් ලබා ගැනීම සඳහා ඔවුන්ට තමන්ගේ වයස්වලින් 1939 සැප්තැම්බර් මස 03 වැනි දින සිට 1949 දෙසැම්බර් මස 31 වැනි දින දක්වා වූ කාලසීමාව තුළ තම තමන් සේවය කළ කාලයන් අඩුකර ගැනීමට ඉඩදෙනු ලැබේ.

6. රාජ්‍ය සේවයෙහි දැනට සේවය කරන නිලධාරීහු

6.1 රාජ්‍ය සේවයෙහි දැනට සේවයෙහි යෙදී සිටින්නාවූත්, අවශ්‍ය සියලු සුදුසුකම් ඇත්තාවූත්, නිලධාරීන් විසින් ඉදිරිපත් කරන අයදුම්පත් ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් එවිය යුතුය. නව තනතුරු සඳහා ඉල්ලුම් කරන්නා වූ ද, රාජ්‍ය සේවයෙහි දැනට ස්ථිර තනතුරු දරන්නා වූ ද, නිලධාරීන්ගෙන් යමෙකු නව තනතුරකට තෝරාගනු ලැබුවහොත් ඒ සඳහා ඔවුන් මුදවාලිය හැකි ද නොහැකි ද යන්න එම නිලධාරීන් සේවයෙහි යෙදී සිටින දෙපාර්තමේන්තුවල ප්‍රධානීන් විසින් ඔවුන්ගේ අයදුම්පත් ඉදිරිපත් කරන විට සඳහන් කළ යුතු ය.

6.2 නියමිත වේලාවක නියමිත ස්ථානයක දී සම්මුඛ පරීක්ෂණයක් සඳහා පෙනී සිටින ලෙස අයදුම්කරුවන්ට නියම කරනු ලැබිය හැක. මේ සම්බන්ධයෙන් දැරීමට සිදුවන ගමන් වියදම් හෝ වෙනත් වියදම් ආදියත් ගෙවනු නොලැබේ.

6.3 යම්කිසි අයදුම්කරුවකු නිර්දේශ කිරීමට අදහස් කරන කෙනෙකු විසින් අයදුම්කරුට චරිත සහතිකයක් දීමෙන් එසේ කළ යුතු ය. යම් අයදුම්කරුවකු තෝරා ගන්නා පරිද්දෙන් කවර අන්දමේ වුව ද අයථා අනුග්‍රහයන් පැතීම හෝ එහිලා යම් බලපෑමක් කිරීමට තැත් කිරීම හෝ එම අයදුම්කරු නුසුදුස්සකු කරනු ලැබීමට හේතුවනු ඇත.

6.4 අයදුම්කරුගේ අයදුම්පතෙහි කිසියම් සාවද්‍ය ප්‍රකාශයක් තිබෙන බැව් ඔහු තෝරා ගැනීමට කලින් දැන ගන්නට ලැබුණි නම් ඒ හේතුවෙන් ඔහු එම තනතුරට නුසුදුස්සකු බවට පත් කරනු ලැබීමටත්, තෝරා ගැනීමෙන් පසු ඒ බව අනාවරණය වුණි නම් ඔහු රාජකාරියෙන් පහකරනු ලැබීමටත් ඉඩ තිබේ.

6.5 මෙම දැන්වීමෙහි සඳහන් වන නියමයන්ට සෑම අතින් ම අනුකූල නොවන අන්දමේ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

7. සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප් යන්නෙහි අර්ථ දැක්වීම

7.1 සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප යන්නෙන් අදහස් කෙරෙනුයේ ඒකාබද්ධ වැටුප පමණකි. වැඩ බැලීමේ වැටුපක් හෝ දීමනා ආදිය ඊට ඇතුළත් නොවන්නේ ය.

8. බඳවා ගැනීම සහ උසස් කිරීම සම්බන්ධ නව ජාතික ප්‍රතිපත්තිය

පසුව නිකුත් කෙරෙන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ මගින් සංශෝධනය කිරීමට යටත්ව 1990.08.09 දිනැති අංක 15/90, 1990.03.05 දිනැති අංක 15/90(I) සහ 1990.06.15 දිනැති අංක 15/90 (I) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛවල දක්වා ඇති ප්‍රතිපත්තියට අනුකූලව රාජ්‍ය සේවයට, පළාත් රාජ්‍ය සේවයට, රාජ්‍ය සංස්ථා අංශයට සහ රජයට සම්පූර්ණයෙන්ම අයත් සමාගම්වලට බඳවා ගැනීම සහ උසස් කිරීම 1990.01.01 වැනි දින සිට සිදුකරනු ඇත.

# විභාග අපේක්ෂකයන් සඳහා නීති සහ උපෙදස්

අවශ්‍ය සාමාන්‍ය සුදුසුකම් :

"1968 අංක 25 දරන විභාගපනතේ දක්වා ඇති විධිවිධානයන්ට අනුකූලව කටයුතු කිරීමට සියලුම විභාගාපේක්ෂකයින් බැඳී ඇත''

සියලු ම විභාගාපේක්ෂකයින් පහත සඳහන් නීති පිළිපැදීමට බැඳී සිටිය යුතුය. මේ නීති කිසිවක් උල්ලංඝනය කරන විභාගාපේක්ෂකයෙකුට විභාග කොමසාරිස්ගේ අභිමතය පරිදි පහත සඳහන් දඬුවම් එකක් හෝ ඊට වැඩි ගණනක් හෝ පමුණුවනු ලැබිය හැකිය :-

(i) මුළු විභාගයටම හෝ ඉන් කොටසකට හෝ නැතහොත් එක් විෂයයකට හෝ ඉන් කොටසකට පෙනී සිටීම හෝ තහනම් කිරීම,

(ii) විභාගයේ එක් විෂයයකට හෝ මුළු විභාගයටම හෝ නුසුදුස්සෙකු කිරීම,

(iii) එක් අවුරුද්දකට හෝ අවුරුදු දෙකකට හෝ කිසිම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම,

(iv) මුළු ජීවිත කාලයේ ම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම,

(v) සහතික පත්‍රය යම්කිසි කාල සීමාවක් තුළ තහනම් කිරීම,

(vi) විභාගාපේක්ෂකයාගේ ක්‍රියා පරිපාටිය සම්බන්ධයෙන් ඔහු ගැන වගකිවයුත්තන්ට සැලකර සිටීම හෝ විභාගාපේක්ෂකයා පොලීසියට භාරදීම හෝ ඔහුගේ ක්‍රියාව සම්බන්ධයෙන් පොලීසියට පැමිණිලි කිරීම.

විභාගයට කලින් හෝ විභාගය පවත්වාගෙන යන අතරතුර හෝ විභාගයට පසුව හෝ කොයිම අවස්ථාවකදී වුවත් එවැනි විභාගාපේක්ෂකයෙකු සම්බන්ධයෙන් ක්‍රියා කිරීමේ බලය විභාග කොමසාරිස් සතු වේ. ඒ සම්බන්ධයෙන් ඔහුගේ තීරණය අවසාන තීරණය වන්නේ ය. එහෙත් රජයේ සේවකයන් බඳවා ගැනීම සඳහා පවත්වනු ලබන විභාග පිළිබඳ ව විභාග කොමසාරිස්ගේ තීරණය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සමීක්ෂණයට යටත් වන්නේ ය.

1. සියලු ම විභාගාපේක්ෂකයන් විභාග ශාලාව තුළදීත් ඒ අසලදීත් විභාග ශාලාධිපතීන්ට ද, ඔහුගේ සහකාරයින්ට ද, අනිකුත් විභාගාපේක්ෂකයින්ට ද බාධාවක් හෝ අවහිරයක් හෝ ඇති නොවන ලෙස ශාන්තදාන්තව හැසිරිය යුතුය. විභාග ශාලාවට ඇතුළු වන විටත්, ඉන් පිටවන විටත් ඉතා සන්සුන් ලීලාවෙන් හැසිරිය යුතුය.

2. විභාගාපේක්ෂකයෝ විභාග ශාලාධිපතීන්ට කීකරු විය යුත්තාහ. එබැවින් ඔවුන් විභාගය පවත්වාගෙන යන අතරතුරත්, විභාගය පටන් ගැනීමට පෙරත්, විභාගය අවසන් වූ විගසත් විභාග ශාලාධිපතීන්ගේ හා ඔහුගේ සහකාරයන්ගේ උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය.

3. විභාගයේ දී ප්‍රශ්න පත්‍රයකට උත්තර ලිවීම පටන්ගෙන පැය භාගයක් ගතවූවාට පසු මොනම කාරණයක් නිසාවත් විභාගාපේක්ෂකයෙකු විභාග ශාලාවට ඇතුළු කරගනු නොලැබේ. විභාගය පටන් ගෙන පැය භාගයක් ගතවන තුරු ප්‍රශ්න පත්‍රයට පෙනී සිටින අපේක්ෂකයෙකුට විභාග ශාලාවෙන් පිටවී යාම තහනම්ය. ප්‍රායෝගික පරීක්ෂණවලට හෝ වාචික පරීක්ෂණවලට පමා වී පැමිණෙන අපේක්ෂකයන් විභාග ශාලාවට ඇතුළු නොකිරීමට ඉඩ තිබේ.

4. සෑම විභාගාපේක්ෂකයෙකුම තමාගේ විභාග අංකය දරන ආසනයේ හැර වෙන කිසිම තැනක වාඩි නොවිය යුතුය. විභාග ශාලාධිපතිගේ විශේෂ අවසරය නොමැතිව තමන්ගේ ස්ථානය වෙනස් නොකළ යුතුයි. තමන්ට නියම නොකරන ලද අසුනක් ගැනීම වංචනික අදහසින් කරන ලද ක්‍රියාවක් වශයෙන් සලකනු ලැබීමට සිදුවේ.

5. විභාග ශාලාව තුළ සම්පූර්ණයෙන් ම නිශ්ශබ්ද ව සිටිය යුතු ය. මොන ම කාරණයක් නිසාවත් විභාග ශාලාව ඇතුළත දී විභාග ශාලාවේ කාර්ය මණ්ඩලයේ කෙනෙකු සමග හැර, විභාග ශාලාව ඇතුළත හෝ පිටත හෝ සිටින කිසිවකු සමග මොනයම් කරුණක් නිසාවත් කතාබස් කිරීම හෝ පණිවුඩ හුවමාරු කර ගැනීම හෝ වෙනත් අන්දමේ ගනුදෙනු කිරීම හෝ සම්පූර්ණයෙන්ම තහනම්ය. යම් කිසි හදිසි වුවමනාවක් සඳහා කිසිවෙකු සමග කතාබස් කිරීමක් අවශ්‍ය වුවහොත් ප්‍රථමයෙන් ඒ සඳහා විභාග ශාලාධිපතින්ගේ අවසරය ලබා ගත යුතු යි.

6. විභාගාපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රය හඳුනාගනු ලබන්නේ ඔහුගේ විභාග අංකයෙන් පමණක් හෙයින් උත්තර පත්‍රවල තමන්ගේ නම නොලිවිය යුතුයි. තමාගේ උත්තර පත්‍රයෙහි අන්‍ය විභාගාපේක්ෂකයෙකුගේ විභාග අංකය ලිවීම වංචනික ක්‍රියාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් ලෙස සලකනු ලැබේ. හඳුනාගත නොහැකි පරිදි විභාග අංකය ලියා ඇති උත්තර පත්‍ර ප්‍රතික්ෂේප කිරීමට ද සිදුවෙනවා ඇත.

7. තමන් වෙත සපයන ලද කඩදාසි හැර තීන්ත පොවන කඩදාසියෙහි හෝ ප්‍රශ්න පත්‍රයෙහි හෝ මේසය මත හෝ වෙන කිසි තැනක හෝ කිසිවක් නොලිවිය යුතුය. මේ නීතිය නොසැලකීම වංචනික චේතනාවකින් යුක්තව ක්‍රියා කිරීමක් ලෙස සැලකිය හැකි වේ.

8. තමන් වෙත සපයන ලද කඩදාසියක් හෝ උත්තර ලියන පොතක් හෝ ඉරාදැමීම හෝ පොඩි කිරීම හෝ නමා දැමීම හෝ අකාමකා දැමීම හෝ නොකළ යුතුය. කටුවැඩ ආදිය සඳහා පාවිච්චි කරන ලද සෑම කඩදාසියක්ම උත්තර පත්‍රයට ඇමිණිය යුතු ය. ඒවා උත්තර පත්‍රයෙහිම කොටසක් විය යුතු ය. එබඳු කටුවැඩ පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. විභාග ශාලාවේ දී ලියන ලද කිසිම දෙයක් ඉන් පිටත ගෙනයෑම තහනම් ය. එකම ප්‍රශ්නයකට පිළිතුරු දෙතැනක ලියැවී තිබේ නම් අනවශ්‍ය පිළිතුරු පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. මේ කරුණු පැහැර හැරීම වංචාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් සේ සැළකීමට ඉඩ තිබේ.

9. ගණිත ප්‍රශ්නවල දී ගණන් වරදවා සාදා හෝ ගණනක් කොහෙත්ම නොසාදා හෝ නිවැරදි පිළිතුරු දැක්වීමත් චිත්‍ර කර්මයේ දී තමන්ගේ චිත්‍රය තවත් අපේක්ෂකයෙකුගේ චිත්‍රයට ආකල්ප මාත්‍රයෙන් හෝ ස්වරූපයෙන් හෝ ක්‍රියාකාරිත්වයෙන් හෝ යනාදියකින් සමානව, එසේ නැතිනම් බොහෝ සෙයින්ම කිට්ටුවම තිබීමත්, වංචා සහගත ක්‍රියාවක් සේ සලකනු ලැබීමට හේතු විය හැකිය.

10. විභාගයේ දී උත්තර ලිවීම සඳහා තමන්ට සපයනු ලබන කඩදාසි හෝ වෙනත් ද්‍රව්‍ය විභාග ශාලාවෙන් පිටතට ගෙනයාම තහනම්ය. මේ සියලුම දෑ විභාග කොමසාරිස් සතුය. මේ නීතිය කඩකිරීම වංචනික චේතනාවකින් යුත් ක්‍රියාවක් ලෙස සැලකීමට හේතු විය හැකිය.

11. තමන් වෙත සපයන ලද ලිපිද්‍රව්‍ය හැර වෙනත් පොත්පත්, සටහන් පොත්, සාක්කුවේ පාවිච්චි කරන නෝට් පොත්, ඇක්සයිස් පොත් හා කඩදාසි කොළ හෝ කැබලි ද, තමන්ගේ පාට පෙට්ටි හා පාර්සල් ආදිය ද, පයිල් කවර, කාඩ්බෝඩ් පෑඩ්, නැවූ ප්‍රවෘත්ති පත්‍ර, බ්‍රවුන් පේපර් යනාදිය ද, විභාග ශාලාව තුළ සිටින කිසි විටෙක තමා වෙත හෝ සමීපයෙහි හෝ තබා නොගත යුතුය. මේ නීතිය කඩ කිරීම දඬුවම් ලැබිය හැකි ක්‍රියාවකි.

12. විභාග ශාලාව තුළ කිසිම අපේක්ෂකයෙකු අත කිසිම පොතපතක් හෝ සටහන් පොතක් හෝ සටහන් ලියන කඩදාසියක් හෝ තබා ගැනීම සම්පූර්ණයෙන්ම තහනම් ය. විභාගශාලාධිපතීන් නියම කළහොත් සෑම අපේක්ෂකයෙක්ම තමන් සන්තකව තිබෙන දෑ මේ මේ යයි සහතික කිරීමට බැඳී සිටී. මේ අවශ්‍යතා කඩකිරීම වංචා සහගත ක්‍රියාවක් කිරීමට යත්න දැරීමක් ලෙස සලකනු ලැබේ.

13. වෙනත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයකින් හෝ පොතපතකින් හෝ පත්‍රයකින් හෝ සටහන් සහිත කොළයකින් හෝ වෙන කිසිවකින් හෝ ගෙන, හොර උත්තර ලිවීම හෙවත් කොපි කිරීම, හොර උත්තර ලිවීමට යත්න දැරීමද තහනම් ය. තවත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයක් දෙස බැලීම ද නොකළ යුතුය. වෙන අයදුම්කරුවෙකුට උදව් දීමෙන් ද, වෙන අයදුම්කරුවෙකුගෙන් හෝ පුද්ගලයෙකුගෙන් හෝ උදව් ලබා ගැනීමෙන් ද සම්පූර්ණයෙන්ම වැළකිය යුතුය. උත්තර ලියා සම්පූර්ණ වූ සෑම කඩදාසියක්ම ලියමින් සිටින කඩදාසිය යට තබා ගත යුතුය. ලියන කඩදාසි මේසය මත විසුරුවා නොදැමිය යුතුය.

14. ප්‍රශ්න පත්‍රයකට උත්තර ලියන අතරතුර මොනම කරුණක් නිසාවත් ස්වල්ප වේලාවකටවත් විභාග ශාලාවෙන් පිටවී යාමට කිසිම අපේක්ෂකයෙකු ඉඩදෙනු නොලැබේ. එහෙත් යම්කිසි හදිසි කරුණක් නිසා විභාගාපේක්ෂකයෙකුට ඉන් පිටත යන්නට උවමනා වුවහොත් විභාග ශාලාධිපතිගේ සහකාර නිලධාරියෙකුගේ සුපරීක්ෂාකාරීත්වය යටතේ විභාග ශාලාවෙන් ඔහුට ස්වල්ප වේලාවකට පිටතට යාමට අවසර දෙනු ලැබේ. එසේ පිටතට යාමට පෙරත් නැවත විභාග ශාලාවට ඇතුළු වන විටත් ඔහු සෝදිසියකට භාජනය විය යුතුය.

15. විභාග ශාලාවේ දී පිළිතුරු ලියන විට විභාගය පටන් ගැනීමට පෙර හෝ නියම විභාග අපේක්ෂකයෙකු වෙනුවට ව්‍යාජ අපේක්ෂකයෙකු පෙනී සිටීම දඬුවම් ලැබිය යුතු ක්‍රියාවකි. අනන්‍යතා පත්‍ර වෙනස් කිරීම හෝ බොරු අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කිරීමත්, කෙනෙකුගේ අනන්‍යතා සහතිකය වෙනස් කිරීමත් එබඳු වරදවල් ය. විභාගාපේක්ෂකයන් එවැනි වරදට අසු නොවිය යුතුය.

16. විභාගඅපේක්ෂකයෙකු නොවන අයෙක් කිසිම අපේක්ෂකයෙකුට අයථා අන්දමින් වංචා සහගත ලෙස උදව් දීම බරපතල වරදක් ලෙස සලකනු ලැබේ.

විභාග අපේක්ෂකයන් විසින් තමන්ගේ පරෙස්සම සඳහා පහත සඳහන් උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය. ඊ''

(i)විභාගය පටන් ගන්නා නියමිත වේලාවට සෑහෙන පමණ කලින් විභාග ශාලාවට පැමිණෙන්න. එක් එක් ප්‍රශ්න පත්‍රය පටන් ගැනීමට නියමිත වේලාවට යටත් පිරිසෙයින් විනාඩි 10කට හෝ 15කට කලින් විභාග ශාලාවට පැමිණ සිටීම සෑහේ. විභාග ශාලාව පිහිටා ඇති ස්ථානය හරිහැටි නොදත් විට විභාගය පටන් ගන්නා දිනයට කලින් ඒ ගැන සොයා බලා නියම ස්ථානය හරි හැටි දැන සිටිය යුතුය.

(ii)යම්කිසි විෂයයකට ඇතුළත්වීම ගැන හෝ යම් විෂයයකට පෙනී සිටීමට ඇති සුදුසුකම් ගැන හෝ සැකයක් ඇති වූ විට එම ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීමට පටන් ගැනීමට පෙර විභාග ශාලාධිපතීන්ට ඒ බැව් සැළකර එම සැකය දුරුකර ගත යුතුයි. එලෙස ක්‍රියා නොකිරීම එම විෂයය හෝ විෂයයන් සම්බන්ධයෙන් තමන්ගේ විභාගාපේක්ෂකත්වය අවලංගු වී යාමට හේතු විය හැකිය.

(iii) විභාගයට පෙනී සිටීමේ දී අපේක්ෂකයන් සෑම විෂයයකටම පෙනී සිටින විට අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කළ යුතුය. අනන්‍යතාවය ඔප්පු කිරීම සඳහා අවශ්‍ය ලියවිලි විභාග ශාලාවේ දී ඉදිරිපත් නොකළහොත් ඔහුගේ විභාගාපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ තිබේ. යම් හෙයකින් ඒ සඳහා අවශ්‍ය ලියවිලි විභාගශාලාවට ගෙන ඒමට අමතක වුවහොත් ඒ බැව් විභාගශාලාධිපතීන්හට දන්වා විභාගය අවසන් වීමට පෙර එය ඉදිරිපත් කිරීමට මං සළසා ගත යුතුය.

(iv) විභාගය සඳහා සාමාන්‍යයෙන් සම්මත වර්ගයකට අයත් ලිපිද්‍රව්‍ය (එනම් ලියන කඩදාසි, තීන්ත පොවන කඩදාසි, ලැජර් කඩදාසි, සාරාංශ ලියන කඩදාසි) ආදිය සපයනු ලැබේ. සාමාන්‍යයෙන් කාටත් බෙදා දෙන වර්ගයකට වෙනස් වූ හෝ අමුතු මෝස්තරයක ලිපි ද්‍රව්‍ය ඔබට ලැබුණහොත් ඒ බව නොපමාව විභාගශාලාධිපතිට දැන්විය යුතුයි. විභාග ශාලාවේ දී ඔබට දෙනු ලබන කඩදාසි හැර වෙන මොනම කඩදාසියක්වත් ප්‍රශ්නවලට උත්තර ලිවීම සඳහා පාවිච්චි නොකළ යුතුයි. ඉතිරි වන කඩදාසි සහ වෙනත් ද්‍රව්‍ය අපිරිසිදු නොකර නැවත ප්‍රයෝජනයට ගත හැකි වන සේ ඔබගේ ලියන මේසය මත තබන්න. ඔබට ලඝුගණක චක්‍ර සපයන ලද්දේ නම් ඒවා පරිස්සමින් පාවිච්චි කොට ඔබේ ලියන මේසය මත තිබෙන්නට හැරිය යුතුය.

(v) විභාගාපේක්ෂකයන් තම තමන්ගේ පෑන්, පැන්සල්, තීන්ත කූඩු, මකන, රෙදි කෑලි, අඩිකෝදූ, ජ්‍යාමිතික උපකරණ, පාට පැන්සල් පෙට්ටි, පාට හුණු පෙට්ටි යනාදිය රැගෙන ආ යුතුයි.

(vi) තමන් පාවිච්චි කරන සෑම කඩදාසියකම පිළිතුරු ලිවීමට පටන් ගැනීමේ දී නොපමාව තමන්ගේ විභාග අංකය හා විභාගයේ නමත් පැහැදිලි ලෙස ලියන්න. කඩදාසියේ දෙපැත්තේම පැහැදිලිව ද පිරිසිදුව ද උත්තර ලියන්න. ප්‍රශ්නයක කොටසකට උත්තර ලිවීමෙන් පසු අනික් කොටස පටන් ගැනීමට පෙර එක රූලක්වත් හිස්ව තිබිය යුතුයි. සම්පූර්ණ ප්‍රශ්නයකට උත්තර ලිවීමෙන් පසු රූලක් හෝ රූල් කීපයක් හෝ හිස්ව තබන්න. ලියන සෑම දෙයක්ම එක ගොඩේ තෝරා බේරා ගන්නට නොහැකි ලෙස නොලිවිය යුතුයි.

(vii) උත්තර ලියන කඩදාසියෙහි වම් පැත්තේ තීරය වෙන්කර ඇත්තේ ප්‍රශ්නවල අංක ලිවීම සඳහා ය. දකුණු පැත්තේ තීරය වෙන්කර ඇත්තේ පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා බැවින් එහි කිසිවක් නොලිවිය යුතුයි. තමන් විසින් උත්තර ලියන ලද ප්‍රශ්නවල අංක වරදවා යෙදීම ව්‍යාකූලත්වයට හේතුවන බැවින් ප්‍රශ්න අංක ඉතා පරෙස්සමින් නිවැරදි ලෙස යෙදිය යුතුය.

(viii) අනිවාර්ය ප්‍රශ්න ද, තෝරා ගත යුතු අන් ප්‍රශ්න ද සම්බන්ධව ප්‍රශ්න පත්‍රයේ මුලින්ම සඳහන් කොට ඇති උපදෙස් ඉතා පරෙස්සමින් කියවා බැලිය යුතුයි. මෙය නොසලකා හැරීමෙන් බොහෝ විට පාඩු සිදුවිය හැකිය.

(ix) ගණිත ප්‍රශ්නවලට උත්තර සපයන විට ගැන බැලීම සහ කටුවැඩ ඒ ඒ ගණන් සෑදීමේ කොටසක් වශයෙන් අනුක්‍රමයෙන් විස්තර ලෙස දැක්විය යුතුය. අවශ්‍ය තැන්වල අඳිනු ලබන රූප සටහන් හා චිත්‍ර ආදිය නිවැරදිව ද සෑහෙන පමණ විශාලව ද තිබිය යුතුයි. පිටු කීපයකට යන දිග පිළිතුරුවල දී එක පිටුවක අඳින ලද රූප සටහන් සම්බන්ධයෙන් ඊළඟ පිටුවලදීත් සිත් යොමුකර විය යුතු අවස්ථාවල දී ඒ රූප සටහන් නැවතත් ඇඳ පෙන්වීම යෝග්‍ය වේ.

(x) එක් එක් ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සපයා අවසන් වූ විට උත්තර ලියන ලද කඩදාසි සියල්ලම ප්‍රශ්නවලට උත්තර ලියූ පිළිවෙල අනුව එකතුකොට වම් පැත්තේ ඉහළ කෙළවරේ තමන්ට සපයන ලද නූල් කැබැල්ලෙන් නොගැලවී යන පරිදි එකට තබා අමුණා ගැටගසන්න. දකුණු පැත්තේ උඩ කෙළවරවල් එකට තබා ගැට නොගසන්න.

(xi) ඔබගේ උත්තර පත්‍රය විභාගශාලාධිපතීන්ට හෝ ඔවුන්ගේ සහකාර මහතකුට හෝ සියතින්ම භාරදිය යුතුය. නැතහොත් ඒවා එකතු කරන තුරු ඔබේ අසුනේම වාඩි වී සිටිය යුතුය. එසේ නොකිරීම ඇතැම් විට ඔබගේ උත්තර පත්‍රය නැති වී යාමට ද ඔබ යම් විෂයයකට ඉදිරිපත් නොවූවකු සේ සලකනු ලැබීමට ද හේතු විය හැකිය. මොනම කරුණක් නිසාවත් ඔබගේ උත්තර පත්‍රය විභාග ශාලාවේ සේවය කරන පියුන් කෙනෙකුට හෝ වෙනයම් සේවකයෙකුට හෝ බාර නොදිය යුතුය.

(xii)යම්කිසි කරුණක් නිසා විභාග ශාලාධිපතීන්ට හෝ ඔහුගේ සහකාර මහතෙකුට හෝ කථා කිරීමට අවශ්‍ය වූ විට ද, කඩදාසි ආදිය අවශ්‍ය වූ විට ද තම ආසනයෙන් නොනැගිට අත පමණක් එසවිය යුතුය.

විභාග කොමසාරිස් ජනරාල්.

පැලවත්ත,
බත්තරමුල්ල,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ දී ය.

# තනතුරු ඇබෑර්තු

### රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

දෙමළ මාධ්‍ය උප්පැන්න, මරණ හා විවාහ (සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් තනතුරු

**ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කය**

මෙහි පහත උපලේඛනයේ සඳහන් කොට්ඨාසවල ඇති උප්පැන්න, මරණ හා විවාහ / අතිරේක විවාහ රෙජිස්ට්‍රාර් තනතුරු සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ.

01. අයදුම්කරුවන් අදාළ උප්පැන්න, මරණ හා විවාහ / අතිරේක විවාහ කොට්ඨාසය තුළ ස්ථිර පදිංචියක් ඇත්තා වූ හා සෑහෙන දේපළක් හිමි ප්‍රදේශවාසීන්ගේ සැලකිල්ල ලබන මනා පෞරුෂයකින් යුත් අය විය යුතු ය.

02. මෙම තනතුර සඳහා ස්ත්‍රී/පුරුෂ දෙපක්ෂයට ම ඉල්ලුම් කළ හැකි ය.

03. අයදුම්පත් භාරගන්නා අවසාන දිනට, අයදුම්කරුවන්ගේ වයස අවුරුදු 30 ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 55 ට නොවැඩි විය යුතු ය. (විශ්‍රාම ගැන්වීමේ උපරිම වයස අවුරුදු 70 වේ.)

04. විවාහ රෙජිස්ට්‍රාර් ධුරයක් සඳහා අයදුම්කරන්නන් විවාහක අය විය යුතු අතර වැන්දඹු හෝ දික්කසාද නොවිය යුතු ය.

05. කොට්ඨාසයේ ජනතාවගේ භාෂා අවශ්‍යතා අනුව දෙවෙනි භාෂාවකින් රාජකාරි කිරීමේ හැකියාව සමග දෙවරකට නොවැඩි වාර ගණනක දී දෙමළ භාෂාව සඳහා සම්මාන සාමාර්ථයක් ඇතුළුව අ. පො. ස. (සා. පෙළ) විභාගයෙන් අවම වශයෙන් සම්මාන 02 ක් සහිතව විෂයයන් 06 කින් සමත්ව සිටිය යුතු ය. *නැතහොත්* ඊට සමාන විභාගයකින් සමත්ව සිටිය යුතු ය.

    ***සැ. යු.-*** අ. පො. ස. (සා. පෙළ) හෝ ඒ සමාන විභාගයක දී එක් විෂයයක් කොටස් දෙකකින් සමන්විත අවස්ථාවල දී, එය එක් විෂයයක් ලෙස සැලකිය යුතු ය. එම විෂයය කොටස් දෙකම සමත් නම් පමණක් විෂය සමත් ලෙස සැලකිය යුතු ය.

06. කොට්ඨාසයේ සියලු දෙනාට හෝ වැඩිදෙනෙකුට පහසුවෙන් ළඟා විය හැකි කොට්ඨාසයේ මධ්‍යගත ස්ථානයක පිහිටි තනතුරේ ගෞරවය රැකෙන ආකාරයේ ගොඩනැගිල්ලක කාර්යාලය පිහිටුවීමට හැකියාව තිබිය යුතු ය.

07. අයදුම්පත් කැඳවනු ලබන උප්පැන්න, මරණ හා විවාහ/ අතිරේක විවාහ කොට්ඨාසයට ඇතුළත් වන ගම් ලැයිස්තුව/ග්‍රාම නිලධාරි වසම්, අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් ආදිය පිළිබඳ අමතර විස්තර පහත උපලේඛනයේ සඳහන් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය හෝ අදාළ ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාල, ග්‍රාම නිලධාරි කාර්යාල, සමෘද්ධි සංවර්ධන සමිති කාර්යාල හා තැපැල් කාර්යාල ආදී කොට්ඨාසයේ ප්‍රසිද්ධ ස්ථානවල ප්‍රදර්ශනය කර ඇති දැන්වීම්වලින් බලාගත හැකිය.

08. මේ සඳහා අවශ්‍ය අයදුම්පත් හා ගම් ලැයිස්තුව/ග්‍රාම නිලධාරි වසම් ඇතුළත් ''ඇමුණුම I'' අදාළ දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම් (දිසාපති) කාර්යාලයෙන් හෝ අදාළ ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් හෝ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලබාගත හැක. අයදුම්පත් රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ නිල වෙබ් අඩවියෙන් ද (www.rgd.gov.lk) ලබා ගත හැක.

09. සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත් **2026 ජූලි මස 13** දින හෝ එදිනට පෙර උපලේඛනයේ සඳහන් ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් යැවිය යුතු ය.

**එස්. ජලදීපන්,**
රෙජිස්ට්‍රාර් ජනරාල්.

2026 මැයි මස 13 දින,
බත්තරමුල්ල, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
අංක 234/ඒ3, රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

*උපලේඛනය*

| *දිස්ත්‍රික්කය* | *ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය* | *ඉල්ලුම්පත් කැඳවන කොට්ඨාසය හා තනතුර* | *ඉල්ලුම්පත් එවිය යුතු ලිපිනය* |
|---|---|---|---|
| ත්‍රිකුණාමලය | මූතූර් | කොඩ්ඩියාර් උතුර කොට්ඨාසයේ උප්පැන්න මරණ හා මූතූර් කොට්ඨාසයේ විවාහ (සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් ධුරය (දෙමළ මාධ්‍යය) | දිස්ත්‍රික් ලේකම්/ අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, ත්‍රිකුණාමලය |
| ත්‍රිකුණාමලය | මූතූර් | කොඩ්ඩියාර් දකුණ කොට්ඨාසයේ උප්පැන්න මරණ හා කොඩ්ඩියාර් පත්තු කොට්ඨාසයේ විවාහ (සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් ධුරය (දෙමළ මාධ්‍යය) | දිස්ත්‍රික් ලේකම්/ අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, ත්‍රිකුණාමලය |
| ත්‍රිකුණාමලය | ඊච්චලම්පත්තු (වෙරුගල්) | ඊච්චලම්පන්නයි කොට්ඨාසයේ උප්පැන්න මරණ හා කොට්ටියාර් පත්තු කොට්ඨාසයේ විවාහ (සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් ධුරය (දෙමළ මාධ්‍යය) | දිස්ත්‍රික් ලේකම්/ අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, ත්‍රිකුණාමලය |
| ත්‍රිකුණාමලය | කුච්චවේලි | කට්ටුකුලම් උතුර කොට්ඨාසයේ විවාහ (සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් ධුරය (දෙමළ මාධ්‍යය) | දිස්ත්‍රික් ලේකම්/ අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, ත්‍රිකුණාමලය |

06 - 112

---

**පරිසර අමාත්‍යාංශය**

## වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුවෙහි ආශ්‍රිත නිලධාරී සේවා ගණයේ III ශ්‍රේණියේ නීති සහකාර තනතුර සඳහා වන බඳවා ගැනීම - 2026

වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුවෙහි ආශ්‍රිත සේවා නිලධාරී ගණයේ III ශ්‍රේණියේ නීති සහකාර තනතුරු 01ක් සඳහා බඳවා ගැනීමට අයදුම්පත් කැඳවන අවසාන දිනට, එනම් 2026.07.13 දිනට 02 වන ඡේදයේ සඳහන් සුදුසුකම් සපුරන අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

**1. බඳවා ගැනීමේ ක්‍රමය :**

**1.1** නිවේදනයේ දක්වා ඇති සුදුසුකම් සම්පූර්ණ කර ඇති අයදුම්කරුවන් අතරින් යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයේ දී දක්වන කුසලතා අනුපිළිවෙල අනුව හා පවතින පුරප්පාඩු සංඛ්‍යාව අනුව තනතුරට බඳවාගනු ලැබේ.

**1.2** මෙහිදී රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද මෙම නිවේදනයේ ඡේද අංක 05 යටතේ සඳහන් ලකුණු දීමේ පටිපාටිය අනුකූලව යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය පවත්වනු ලැබේ.

**1.3** අපේක්ෂකයන් එක් අයෙකුට වැඩි ගණනක් සමාන මුළු ලකුණු සංඛ්‍යාවක් ලබා ඇත්නම්, එවැනි අවස්ථාවක සුදුසු තීරණයක් ගැනීම පත්වීම් බලධරයා ලෙස අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් තීරණය කරනු ලබන අතර එය අවසාන තීරණය වනු ඇත.

**1.4** මෙම තනතුර සඳහා පත්වීම් ක්‍රියාත්මක වන දිනය පත්වීම් බලධරයා ලෙස වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුවෙහි අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් තීරණය කරනු ලැබේ.

**2. සුදුසුකම් :**

**2.1 අධ්‍යාපන සුදුසුකම් :**

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් නීතිවේදී උපාධිය ලබා තිබීම හෝ ශ්‍රේෂ්ඨාධිකරණ නීතිඥයෙකු වශයෙන් දිවුරුම් දී තිබීම.

**2.2 පළපුරුද්ද :**

අදාළ නොවේ. එහෙත් යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයේ දී පළපුරුද්ද සඳහා ලකුණු ලබා දෙනු ලැබේ.

**2.3 කායික සුදුසුකම් :**

සෑම අපේක්ෂකයෙකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත් තනතුරේ රාජකාරී ඉටු කිරීමටත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතු ය.

**2.4 වයස :**

**2.4.1.** අවම සීමාව : අවුරුදු 21 ට නොඅඩු
**2.4.2.** උපරිම සීමාව : අවුරුදු 35 ට නොවැඩි

**2.5 වෙනත් :**

**2.5.1.** ශ්‍රී ලංකාවේ පුරවැසියකු විය යුතු ය.

**2.5.2.** අයදුම්කරුවන් විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතු ය.

**2.5.3.** තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය 2.1 සිට 2.5 දක්වා සුදුසුකම් අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ / *ගැසට් පත්‍රයේ* සඳහන් වන දිනට සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතු ය.

**3. සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි හා සේවා කොන්දේසි :**

**3.1** මෙම තනතුර ස්ථිර විශ්‍රාම වැටුප් සහිත වේ. විශ්‍රාම වැටුප් ක්‍රමය සම්බන්ධයෙන් රජය විසින් ඉදිරියේ දී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයන්ට යටත් විය යුතු ය.

**3.2** අවුරුදු 03ක පරිවාස කාලයකට යටත් ය.

**3.3** තෝරාගනු ලබන අපේක්ෂකයින් දිවයින තුළ නියම කරනු ලබන ඕනෑම ප්‍රදේශයක සේවය කළ යුතු ය.

**3.4** භාෂා ප්‍රවීණතාවය:

**3.4.1.** රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය :

ඉංග්‍රීසි භාෂා මාධ්‍යයෙන් සේවයට බඳවාගත් නිලධාරියෙකු පරිවාස කාලය තුළ සිංහල හෝ දෙමළ භාෂාවක ප්‍රවීණතාවය ලබාගත යුතු ය. එම ප්‍රවීණතා මට්ටම වන්නේ අ.පො.ස.(සා.පෙළ) විභාගයෙන් සිංහල / දෙමළ භාෂාව ප්‍රධාන විෂයයක් ලෙස සමත් වීම (දෙවන භාෂාව හෝ වෛකල්පිත විෂයයක් වශයෙන් නොවේ) හා රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව විසින් පවත්වන විශේෂිත කුසලතා විභාගයෙන් සමත් වීම.

**3.4.2.** අනෙක් රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය :

| *ප්‍රවීණතාවය ලබාගත යුතු කාලසීමාව* | *ලබා ගත යුතු ප්‍රවීණතා මට්ටම* | *භාෂා ප්‍රවීණතාවය* | |
|---|---|---|---|
| | | *සේවයට බඳවා ගත් භාෂා මාධ්‍ය* | *භාෂා ප්‍රවීණතාවය ලබා ගත යුතු භාෂාව* |
| සේවයට බැඳි පළමු වසර තුන(3) ඇතුළත | රාජ්‍ය සේවා චක්‍රලේඛ අංක 07/2007 හා ඊට අනුශාංගික චක්‍රලේඛ අනුව අදාළ මට්ටමේ භාෂා ප්‍රවීණතාව ලබාගත යුතු ය. | සිංහල | දෙමළ |
| | | දෙමළ | සිංහල |
| | | ඉංග්‍රීසි | උපඡේද අංක 3.4.1 යටතේ ප්‍රවීණතාවය ලබා ගත් රාජ්‍ය භාෂාව හැර අනෙක් රාජ්‍ය භාෂාව |

**4. මාසික වැටුප් පරිමාණය :**

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක : **10/2025 හි MN 4 -2025** වැටුප් කාණ්ඩය අනුව මෙම තනතුරට **රු.53,060/-10x800-11x1,190-10x1,320-5x1,350 = රු.94,100/= මාසික වැටුප් පරිමාණයක් හිමිය.** (එම වැටුප ගෙවනු ලබන්නේ 2025.03.25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 10/2025 හි විධිවිධානවලට අනුව එහි උපලේඛන II හි සඳහන් පරිදි වේ.)

**5. යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය සඳහා පහත සඳහන් ලකුණු පටිපාටිය පදනම් කර ගනු ලැබේ.**

**සංලක්ෂය :-**

| | *විෂයය* | | *උපරිම ලකුණු* |
|---|---|---|---|
| 01 | **අතිරේක අධ්‍යාපන සුදුසුකම්:**<br><br>විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලද නීතිය පිළිබඳ උපාධිය<br>- පළමු පන්තියේ සාමාර්ථයක් සඳහා | 15 | 15 |
| | - දෙවන පංතියේ ඉහළ සාමාර්ථයක් සඳහා | 12 | |
| | - දෙවන පංතියේ පහළ සාමාර්ථයක් සඳහා | 10 | |
| | නීති විද්‍යාලයේ අවසාන වසරේ පළමු පන්තියේ සාමාර්ථයක් සඳහා | 15 | |
| | නීති විද්‍යාලයේ අවසාන වසරේ දෙවන පන්තියේ සාමාර්ථයක් සඳහා | 10 | |
| | *සටහන* - ගෞරව සාමාර්ථයක් සමඟ අවසන් විභාගය සමත් වී ඇත්නම් පමණක් ලකුණු 10ක් ලබා දිය යුතුය.<br>(උපරිම සුදුසුකම සඳහා පමණක් ලකුණු ලබා දේ - උපාධිය හෝ නීති විද්‍යාල සුදුසුකම්වලින් එකක් සඳහා පමණක්) | | |
| 02 | **වෘත්තීය සුදුසුකම් (උපරිම ලකුණු)**<br><br>විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් හෝ ආයතනයක් මගින් ලබාදෙන අදාළ ක්ෂේත්‍රය පිළිබඳව අවුරුද්දකට නොඅඩු පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක් හෝ පශ්චාත් නීති ඩිප්ලෝමා පාඨමාලාවක් සඳහා (එක් ඩිප්ලෝමාවකට ලකුණු 05 බැගින්)<br><br>පිළිගත් ආයතනයක් විසින් ලබාදෙන අදාළ ක්ෂේත්‍රය පිළිබඳ මාස 06කට නොඅඩු ඩිප්ලෝමා පාඨමාලාවක් සඳහා (එක් ඩිප්ලෝමාවකට ලකුණු 03 බැගින්)<br><br>පිළිගත් ආයතනයක් විසින් ලබාදෙන අදාළ ක්ෂේත්‍රය පිළිබඳ මාස 03කට නොඅඩු සහතික පත්‍ර පාඨමාලාවක් සඳහා (එක් පාඨමාලාවකට ලකුණු 02 බැගින්) | | 20 |
| 03 | **අතිරේක පළපුරුද්ද :**<br><br>නීතිඥවරයෙකු ලෙස රාජ්‍ය සේවයේ හෝ පෞද්ගලික අංශයේ පළපුරුද්ද -<br>- එක් වසරකට ලකුණු 05 බැගින් උපරිමය ලකුණු 20<br>- මාස 06 කට වැඩි හා අවුරුද්දකට අඩු ලකුණු 02<br>(මූලික සුදුසුකම් ලබා ගැනීම සඳහා අවශ්‍ය වන නීතිඥයෙක් ලෙස කටයුතු කර වසර 03ක සේවා කාලය හැර)<br>(අවුරුදු 20කට නොඅඩු සේවා කාලයක් සම්පූර්ණ කරන ලද නීතිඥවරයෙකුගේ හෝ ජනාධිපති නීතිඥවරයෙකුගේ හෝ විනිසුරුවරයෙකුගෙන් ලබාගත් සහතිකයක් මගින් අතිරේක පළපුරුද්ද සනාථ කළ යුතුය. මුද්‍රාව යොදා තිබීම අනිවාර්ය වේ.) | | 20 |

| | විෂයය | | උපරිම ලකුණු |
|---|---|---|---|
| 04 | **භාෂා දැනුම - ඉංග්‍රීසි භාෂාවට ලබා ඇති ප්‍රවීණතාවය :** | | 20 |
| | ඉංග්‍රීසි මාධ්‍යයෙන් හදාරන ලද පශ්චාත් උපාධිය / උපාධිය / පශ්චාත් නීතිවේදී උපාධිය/ නීතිවේදී උපාධිය<br>(අදාළ විභාග ප්‍රශ්න පත්‍ර සියල්ල සඳහා ඉංග්‍රීසි මාධ්‍යයෙන් පිළිතුරු සපයා තිබිය යුතු ය.) | 20 | |
| | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයක හෝ රජයේ පිළිගත් ආයතනයක ඉංග්‍රීසි භාෂාව පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාවක් සඳහා (වසර 01 හෝ පැය 1500) | 10 | |
| | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයක හෝ රජයේ පිළිගත් ආයතනයක ඉංග්‍රීසි භාෂාව පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාවක් සඳහා | | |
| | - මාස 06 / පැය 720 | 07 | |
| | - මාස 03 / පැය 360 | 05 | |
| 05 | **තොරතුරු තාක්ෂණය පිළිබඳ දැනුම :** | | 20 |
| | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයක උපාධියක් සඳහා තොරතුරු තාක්ෂණය ප්‍රධාන විෂයයක් ලෙස හදාරා තිබීම සඳහා | 20 | |
| | රජයේ පිළිගත් ආයතනයක අවුරුදු 01 කට නොඅඩු තොරතුරු තාක්ෂණය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාවක් සඳහා හෝ පැය 1500ක පාඨමාලාවක් සඳහා | 10 | |
| | රජයේ පිළිගත් ආයතනයක තොරතුරු තාක්ෂණය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාවක් සඳහා | | |
| | - මාස 06 / පැය 720 | 07 | |
| | - මාස 03 / පැය 360 | 05 | |
| 06 | සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයේ අභිමතය පරිදි නායකත්වය , පෞරුෂත්වය හා සන්නිවේදන කුසලතා: | | 05 |
| | **මුළු එකතුව** | | 100 |

* ඉහත සුදුසුකම් ලිඛිතව සනාථ කළ යුතු ය.

**6. අපේක්ෂකයන්ගේ අනන්‍යතාවය**

**6.1** යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලබන්නේ සෑම ආකාරයෙන්ම සම්පූර්ණ අයදුම්පත් ඉදිරිපත් කර ඇති අපේක්ෂකයන් පමණි.

**6.2** සම්මුඛ පරීක්ෂණයේ දී සියලුම සහතිකවල මුල් පිටපත් හා නිසි පරිදි සහතික කරන ලද පිටපත් ඉදිරිපත් කළ යුතු ය.

**6.3** සම්මුඛ පරීක්ෂණයේ දී අපේක්ෂකයන් විසින් තම අනන්‍යතාවය සඳහා පහත සඳහන් අනන්‍යතාපත්‍රවලින් එකක් ඉදිරිපත් කළ යුතු ය.

**6.3.1.** පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මගින් නිකුත් කර ඇති ජාතික හැඳුනුම්පත,
**6.3.2.** වලංගු විදේශ ගමන් බලපත්‍රය,
**6.3.3.** වලංගු රියැදුරු බලපත්‍රය.

**7. අයදුම් කිරීමේ ක්‍රමය :**

**7.1** අයදුම්පත්‍රය මෙම නිවේදනයට අමුණා ඇති ආදර්ශ ආකෘතියට අනුකූල විය යුතු අතර A4 ප්‍රමාණයේ කඩදාසියක අයදුම්පත ශීර්ෂ අංකය 01 සිට 06 දක්වා පළමු පිටුවේ ද 07 සිට 09 දක්වා දෙවන පිටුවේ ද 10 සිට 11 දක්වා තෙවන පිටුවේ ද වන සේ සකස් කර තමාගේ අත් අකුරින්ම පැහැදිලිව සම්පූර්ණ කළ යුතු ය. ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූල නොවන අයදුම්පත්

සහ අසම්පූර්ණ ලෙස තොරතුරු සඳහන් කර ඇති අයදුම්පත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. (අයදුම්පත්‍රයේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් විය හැකිය)

**7.2** සම්පූර්ණ කරන ලද අයදුම්පත් අධ්‍යක්ෂ ජනරාල්, වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව, තැ.පෙ. 556, නව මහලේකම් කාර්යාලය, මාළිගාවත්ත, කොළඹ 10 යන ලිපිනයට, වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් වෙත ලැබෙන සේ 2026.07.13 දිනට හෝ එදිනට ප්‍රථම ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය. අයදුම්පත බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරෙහි "වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුවෙහි නීති සහකාර තනතුර සඳහා වන බඳවා ගැනීම - 2026" යනුවෙන් සඳහන් කළ යුතු ය. එදිනට පසුව ලැබෙන කිසිදු අයදුම්පතක් භාරගනු නොලැබේ.

**7.3** අයදුම්පත්‍රයේ අපේක්ෂිතයාගේ අත්සන රජයේ විදුහලක විදුහල්පතිවරයෙකු/ සාමදාන විනිශ්චයකාරවරයෙකු/දිවුරුම් කොමසාරිස්වරයෙකු / නීතිඥවරයෙකු / ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු / ත්‍රිවිධ හමුදාවේ අධිකාරිලත් නිලධාරියෙකු හෝ රු.82,150/= ක මාසික ඒකාබද්ධ වැටුපක් ලබන රජයේ ස්ථිර තනතුරක් ලබන නිලධාරියෙකු විසින් සහතික කළ යුතු ය.

**8.** **සාවද්‍ය තොරතුරු සැපයීම :**

අපේක්ෂකයෙකු තම අයදුම්පත්‍රයේ සඳහන් කර ඇති කිසියම් තොරතුරක් අසත්‍ය බව වැරදි බව හෝ බඳවා ගැනීමට ප්‍රථම අනාවරණය වුවහොත් ඔහුගේ හෝ ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ. එබඳු අසත්‍ය හෝ වැරදි තොරතුරු පිළිබඳව බඳවා ගැනීමෙන් පසුව අනාවරණය වුවහොත් ඊට අදාළ නීති ක්‍රියාමාර්ගයන්ට යටත්ව ඔහු හෝ ඇය රජයේ සේවයෙන් පහ කිරීමට කටයුතු කරනු ලැබේ.

- මෙම නිවේදනයේ සිංහල, දෙමළ ඉංග්‍රීසි භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් ඇති වුවහොත් එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්වේ.

**මහාචාර්ය පී.බී. ටර්නි ප්‍රදීප් කුමාර,**
අධ්‍යක්ෂ ජනරාල්.

**2026 ජුනි මස 04 දින,**
වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව.

**ආදර්ශ අයදුම් පත්‍රය**

***පරිසර අමාත්‍යාංශය***

වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුවෙහි ආශ්‍රිත නිලධාරී සේවා ගණයේ III ශ්‍රේණියේ නීති සහකාර තනතුර සඳහා වන බඳවා ගැනීම - 2026

1. මුලකුරු සමග නම-:
.......................................................................................................................................................
.......................................................................(මයා/මිය/මෙනවිය)
සිංහලෙන්-:
.......................................................................................................................................................
.......................................................................................................................................................
ඉංග්‍රීසියෙන්-:
.......................................................................................................................................................
.......................................................................................................................................................

1.1. මුලකුරුවලින් හැඳින්වෙන නම (පැහැදිලි අකුරෙන්)

සිංහලෙන්-:
.......................................................................................................................................................
.......................................................................................................................................................
ඉංග්‍රීසියෙන්-:
.......................................................................................................................................................
.......................................................................................................................................................

2. ජාතික හැඳුනුම්පත් අංකය-:.................................................

3. උපන් දිනය -:
වර්ෂය:.......................... මාසය:................................ දිනය:................................

ස්ත්‍රී / පුරුෂභාවය ස්ත්‍රී - 1 පුරුෂ - 0 ☐

5. ස්ථිර ලිපිනය (පැහැදිලි අකුරෙන්) – :
..............................................................................................................................................................
..............................................................................................................................................................

6. දුරකථන අංකය -: ස්ථාවර:.............................. ජංගම:.....................................

7. අධ්‍යාපන සුදුසුකම් -:

7.1. අ.පො.ස.(උ.පෙළ) විභාගය පිළිබඳ විස්තර :

I. විභාගයේ වර්ෂය හා මාසය -:.........................................................
II. විභාග අංකය -:.........................................................
III. සමත් වූ වර්ෂයන් -:.........................................................

| *විෂයය* | *ශ්‍රේණිය* |
|---|---|
| 1. | |
| 2. | |
| 3. | |
| 4. | |

7.2. තනතුරට අදාළ සුදුසුකම් -:

| *අදාළ සුදුසුකම්* | *සුදුසුකම් ලැබූ ආයතන* | *වලංගු දිනය* |
|---|---|---|
| | | |

7.3. අමතර සුදුසුකම්-:

8. ඔබ කවරදාක හෝ චෝදනාවක් සඳහා උසාවියකින් වරදකරු වී තිබේ ද ? ඔව්/නැත

8.1. ඔව් නම් විස්තරය සඳහන් කරන්න -:
..............................................................................................................................................................
..............................................................................................................................................................

9. තොරතුරු විමසිය හැකි ඥාතීන් නොවන පුද්ගලයින් -:

1. නම -:
තනතුර -:
ලිපිනය -:
දුරකථන අංකය -:

2. නම -:
තනතුර -:
ලිපිනය -:
දුරකථන අංකය -:

10. අයදුම්කරුගේ සහතිකය -:

(අ) මෙම අයදුම්පතෙහි මා විසින් සපයා ඇති තොරතුරු මා දන්නා තරමින් සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කර සිටිමි.
(ආ) මා විසින් කරනු ලැබ ඇති මෙම ප්‍රකාශය අසත්‍ය බව ඔප්පු වුවහොත් මා සේවයට බඳවා ගැනීමට නුසුදුස්සෙකු වන බව හා පත්වීම් ලැබීමෙන් පසු එසේ ඔප්පුවුවහොත් සේවයෙන් පහ කරනු ලැබීමට යටත් වන බව දන්වා සිටිමි.
(ඇ) මෙහි සඳහන් කිසිදු තොරතුරක් පසුව වෙනස් නොකරමි.

දිනය:.....................................

.........................................................,
අයදුම්කරුගේ අත්සන.

11. අයදුම්කරුගේ අත්සන සහතික කිරීම -:

මෙම අයදුම්පත් ඉදිරිපත් කරන ......................................................................................නමැති අය මා පෞද්ගලිකව හඳුනන බවත්, ඔහු /ඇය ........................................... දින මා ඉදිරිපිට දී ඉහත 10 ඡේදය යටතේ අත්සන් තබන ලද බවත් සහතික කරමි.

.................................................................,
සහතික කරන අයගේ අත්සන.

දිනය -:
සහතික කරන අයගේ නම -:
තනතුර -:
ලිපිනය -:
(නිල මුද්‍රාවෙන් සනාථ කරන්න)

06 - 120

---

**පරිසර අමාත්‍යාංශය**

## වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුවෙහි ප්‍රාථමික අර්ධ ශිල්පීය සේවා ගණයට අයත් සංචාරක බංගලා භාරකරු තනතුර සඳහා බඳවා ගැනීම - 2026

වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුවෙ හි ප්‍රාථමික අර්ධ ශිල්පීය සේවා ගණයට අයත් සංචාරක බංගලා භාරකරු තනතුරු 04 ක් සඳහා බඳවා ගැනීමට අයදුම්පත් කැඳවන අතර අවසාන දිනට, එනම් 2026.07.13 දිනට 02 වන ඡේදයේ සඳහන් සුදුසුකම් සපුරන අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

**1. බඳවා ගැනීමේ ක්‍රමය**

නිවේදනයේ දක්වා ඇති සුදුසුකම් සම්පූර්ණ කර ඇති අයදුම්කරුවන් අතරින් යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත බඳවා ගනු ලැබේ.

**1.1** මෙහිදී රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද මෙම නිවේදනයේ ඡේද අංක 05 යටතේ සඳහන් ලකුණු දීමේ පටිපාටිය අනුකූලව යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය පවත්වනු ලැබේ.

**1.2** සුදුසුකම් ලැබූ අයදුම්කරුවන් අතුරින් යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයේ දී දක්වන කුසලතා අනුපිළිවෙල අනුව හා පවතින පුරප්පාඩු සංඛ්‍යාව අනුව තනතුරු සඳහා බඳවා ගනු ලැබේ.

**1.3** අපේක්ෂකයන් එක් අයකුට වැඩි ගණනක් සමාන මුළු ලකුණු සංඛ්‍යාවක් ලබා ඇත්නම්, එවැනි අවස්ථාවක සුදුසු තීරණයක් ගැනීම පත්වීම් බලධරයා ලෙස අධ්‍යක්ෂ ජනරාල්වරයා වන මා විසින් තීරණය කරනු ලබන අතර, එය අවසාන තීරණය වනු ඇත.

**1.4** මෙම තනතුර සඳහා පත්වීම් ක්‍රියාත්මක වන දිනය පත්වීම් බලධරයා ලෙස වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුවෙහි අධ්‍යක්ෂ ජනරාල්තුමා විසින් තීරණය කරනු ලැබේ.

**2. සුදුසුකම්**

**2.1 අධ්‍යාපන සුදුසුකම් :**
අධ්‍යයන පොදු සහතිකපත්‍ර සාමාන්‍ය පෙළ විභාගයෙන් දෙවරකට නොවැඩි වාර ගණනක දී යටත් පිරිසෙයින් සම්මාන දෙකක් සහිතව විෂයයන් 06 ක් සමත් වී තිබීම.

**2.2 වෘත්තීය සුදුසුකම් :**

එක් එක් තනතුරෙහි කාර්යභාරයට අදාළව තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන කාර්මික/ වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කරන ලද ජාතික වෘත්තීය කුසලතාවන්හි (N.V.Q.) 02 මට්ටමට නොඅඩු මට්ටමක ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.

**2.3 පළපුරුද්ද :**

අදාළ ක්ෂේත්‍රයේ පළපුරුද්ද අමතර සුදුසුකමක් ලෙස සැලකේ.

**2.4 කායික සුදුසුකම් :**

විශිෂ්ට චරිතයකින් හා මනා ශාරීරික සෞඛ්‍යයෙන් හා තනතුරේ රාජකාරි කිරීමට ප්‍රමාණවත් ශාරීරික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතු අතර, දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට බැඳී සිටිය යුතු ය.

**2.5 වයස :**

**2.5.1.** අවම සීමාව : අවුරුදු 18 ට නොඅඩු
**2.5.2.** උපරිම සීමාව : අවුරුදු 45 ට නොවැඩි

**2.6 වෙනත් :**

**2.5.1.** ශ්‍රී ලංකාවේ පුරවැසියකු විය යුතු ය.

**2.5.2.** අයදුම්කරුවන් විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතු ය.

**2.5.3.** තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය 2.1 සිට 2.5 දක්වා සුදුසුකම් අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ / *ගැසට් පත්‍රයේ* සඳහන් වන දිනට සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතු ය.

**3. සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි හා සේවා කොන්දේසි**

**3.1** මෙම තනතුර ස්ථිර විශ්‍රාම වැටුප් සහිත වේ. විශ්‍රාම වැටුප් ක්‍රමය සම්බන්ධයෙන් රජය විසින් ඉදිරියේ දී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයන්ට යටත් විය යුතු ය.

**3.2** අවුරුදු 03ක පරිවාස කාලයකට යටත් ය.

**3.3** තෝරා ගනු ලබන අපේක්ෂකයින් දිවයින තුළ නියම කරනු ලබන ඕනෑම ප්‍රාද්ශයක සේවය කළ යුතු ය.

**3.4** භාෂා ප්‍රවීණතාවය:

**3.4.1.** රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය :

| *භාෂාව* | *ලබාගත යුතු ප්‍රවීණතාවය* |
|---|---|
| 01. රාජ්‍ය භාෂාව | රාජ්‍ය භාෂාවක් නොවන භාෂා මාධ්‍යකින් සේවයට බැඳුනු සේවකයන් විසින් රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය පරිවාස කාලය තුළ ලබා ගත යුතු ය. |
| 02. අනෙක් රාජ්‍ය භාෂාව | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 01/2024 හා ඊට ආනුෂංගික චක්‍රලේඛ අනුව අදාළ මට්ටමේ ප්‍රවීණතාවය ලබා ගත යුතු ය. |

**4. මාසික වැටුප් පරිමාණය :**

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක : **10/2025 හි PL - 2 -2025 වැටුප් කාණ්ඩය අනුව මෙම තනතුරට රු.41,800/- 10x490-10x540-10x590-12x630 = රු.65,560/= මාසික වැටුප් පරිමාණයක් හිමිය.**

(එම වැටුප ගෙවනු ලබන්නේ 2025.03.25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 10/2025 හි විධිවිධාන වලට අනුව එහි උපලේඛන II හි සඳහන් පරිදි වේ.)

**5.** **යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය සඳහා පහත සඳහන් ලකුණු පටිපාටිය පදනම් කර ගනු ලැබේ.**

**සංලක්ෂය**

**5.1** **යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය සඳහා පහත සඳහන් ලකුණු පටිපාටිය පදනම් කරගනු ලැබේ :-**

| | *විෂයය* | | *උපරිම ලකුණු* |
|---|---|---|---|
| 01 | **අතිරේක අධ්‍යාපන සුදුසුකම්:** | | |
| | - අධ්‍යාපන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විෂයයන් තුන සමත් නම් | 15 | 15 |
| | - අධ්‍යාපන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විෂයයන් දෙකක් සමත් නම් | 10 | |
| | - අධ්‍යාපන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) එක් විෂයයක් සමත් නම් | 05 | |
| 02 | **අතිරේක වෘත්තීය සුදුසුකම් :** | | |
| | තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් ආයතනයක් මගින් ලබාදෙන අදාළ ක්ෂේත්‍රය පිළිබඳ අවුරුද්දක නොඅඩු ඩිප්ලෝමා පාඨමාලාවක් සඳහා | 35 | 35 |
| | තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් ආයතනයක් මගින් ලබාදෙන අදාළ ක්ෂේත්‍රය පිළිබඳ මාස 06කට නොඅඩු ඩිප්ලෝමා පාඨමාලාවක් සඳහා | 25 | |
| | තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් ආයතනයක් මගින් ලබාදෙන අදාළ ක්ෂේත්‍රය පිළිබඳ මාස 03කට නොඅඩු සහතික පත්‍ර පාඨමාලාවක් සඳහා | 15 | |
| 03 | **අතිරේක පළපුරුද්ද :** | | |
| | අදාළ ක්ෂේත්‍රයට අදාළව ආයතනයක සේවය කර ඇති කාලය මත ලකුණු ලබා දෙනු ලැබේ.<br>- එක් වසරකට ලකුණු 05 බැගින් උපරිමය ලකුණු 45<br>- මාස 06 කට වැඩි හා අවුරුද්දකට අඩු ලකුණු 02<br>(අදාළ ආයතනයෙන් ලබාගත් සේවා සහතිකයක් මගින් අතිරේක පළපුරුද්ද සනාථ කළ යුතු ය. මුද්‍රාව යොදා තිබීම අනිවාර්ය වේ.) | | 45 |
| 04 | සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයේ අභිමතය පරිදි නායකත්වය, පෞරුෂත්වය හා සන්නිවේදන කුසලතා : | | 05 |
| | **මුළු එකතුව** | | 100 |

ඉහත සුදුසුකම් ලිඛිතව සනාථ කළ යුතු ය.

**6.** **අපේක්ෂකයන්ගේ අනන්‍යතාවය**

**6.1** යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලබන්නේ සෑම ආකාරයෙන්ම සම්පූර්ණ අයදුම්පත් ඉදිරිපත් කර ඇති අපේක්ෂකයන් පමණි.

**6.2** සම්මුඛ පරීක්ෂණයේ දී සියළුම සහතික වල මුල් පිටපත් හා නිසි පරිදි සහතික කරන ලද පිටපත් ඉදිරිපත් කළ යුතු ය.

**6.3** සම්මුඛ පරීක්ෂණයේ දී අපේක්ෂකයන් විසින් තම අනන්‍යතාවය සඳහා පහත සඳහන් අනන්‍යතාපත්‍ර වලින් එකක් ඉදිරිපත් කළ යුතු ය:-

**6.3.1.** පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මගින් නිකුත් කර ඇති ජාතික හැඳුනුම්පත;

**6.3.2.** වලංගු විදේශ ගමන් බලපත්‍රය;

**6.3.3.** වලංගු රියදුරු බලපත්‍රය.

**7. අයදුම් කිරීමේ ක්‍රමය :**

**7.1** අයදුම්පත්‍රය මෙම නිවේදනයට අමුණා ඇති ආදර්ශ ආකෘතියට අනුකූල විය යුතු අතර, A4 ප්‍රමාණයේ කඩදාසියක අයදුම්පත ශීර්ෂ අංකය 01 සිට 06 දක්වා පළමු පිටුවේද 07 සිට 09 දක්වා දෙවන පිටුවේ ද 10 සිට 11 දක්වා තෙවන පිටුවේ ද වන සේ සකස් කර තමාගේ අත් අකුරින්ම පැහැදිලිව සම්පූර්ණ කළ යුතු ය. ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූල නොවන අයදුම්පත් සහ අසම්පූර්ණ ලෙස තොරතුරු සඳහන් කර ඇති අයදුම්පත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. (අයදුම්පත්‍රයේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් විය හැකිය)

**7.2** සම්පූර්ණ කරන ලද අයදුම්පත් අධ්‍යක්ෂ ජනරාල්, වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව, තැ.පෙ. 556, නව මහලේකම් කාර්යාලය, මාළිගාවත්ත, කොළඹ 10 යන ලිපිනයට , වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් වෙත ලැබෙන සේ **2026.07.13** දිනට **හෝ එදිනට ප්‍රථම** ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය. අයදුම්පත බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරෙහි “වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුවෙහි නීති සහකාර තනතුර සඳහා බඳවා ගැනීම - 2026 “ යනුවෙන් සඳහන් කළ යුතු ය. එදිනට පසුව ලැබෙන කිසිදු අයදුම්පතක් භාරගනු නොලැබේ.

**7.3** අයදුම්පත්‍රයේ අපේක්ෂිතයාගේ අත්සන රජයේ විදුහලක විදුහල්පතිවරයකු/ සාමදාන විනිශ්චයකාරවරයකු / දිවුරුම් කොමසාරිස්වරයකු / නීතිඥවරයකු / ප්‍රසිද්ධ නොතාරිස්වරයකු / ත්‍රිවිධ හමුදාවේ අධිකාරිලත් නිළධාරියකු හෝ රු.82,150/= ක මාසික ඒකාබද්ධ වැටුපක් ලබන රජයේ ස්ථිර තනතුරක් ලබන නිලධාරියකු විසින් සහතික කළ යුතු ය.

**8. සාවද්‍ය තොරතුරු සැපයීම :**

අපේක්ෂකයකු තම අයදුම්පත්‍රයේ සඳහන් කර ඇති කිසියම් තොරතුරක් අසත්‍ය බව වැරදි බව හෝ බඳවා ගැනීමට ප්‍රථම අනාවරණය වුවහොත් ඔහුගේ හෝ ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ. එබඳු අසත්‍ය හෝ වැරදි තොරතුරු පිළිබඳව බඳවා ගැනීමෙන් පසුව අනාවරණය වුවහොත් ඊට අදාළ නීති ක්‍රියාමාර්ගයන්ට යටත්ව ඔහු හෝ ඇය රජයේ සේවයෙන් පහ කිරීමට කටයුතු කරනු ලැබේ.

- මෙම නිවේදනයේ සිංහල දෙමළ ඉංග්‍රීසි භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් ඇති වුවහොත් එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්වේ.

**මහාචාර්ය පී.බී. ටර්නි ප්‍රදීප් කුමාර,**
අධ්‍යක්ෂ ජනරාල්.

වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව.
**2026.06.**

**ආදර්ශ අයදුම් පත්‍රය**

***පරිසර අමාත්‍යාංශය***

වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුවේ සංචාරක බංගලා භාරකරු තනතුර සඳහා බඳවා ගැනීම - 2026

**අයදුම් කරන භාෂා මාධ්‍යය**

සිංහල - 2
දෙමළ - 3
ඉංග්‍රීසි - 4

☐

1. මුලකුරු සමග නම :
.....................................................................................................................................................................
........................................................................(මයා/මිය/මෙනවිය)

සිංහලෙන්-:
..............................................................................................................................................................
..............................................................................................................................................................
ඉංග්‍රීසියෙන්-:
..............................................................................................................................................................
..............................................................................................................................................................

1.1. මුලකුරුවලින් හැඳින්වෙන නම (පැහැදිලි අකුරෙන්)

සිංහලෙන්-:
..............................................................................................................................................................
..............................................................................................................................................................
ඉංග්‍රීසියෙන්-:
..............................................................................................................................................................
..............................................................................................................................................................

2. ජාතික හැඳුනුම්පත් අංකය-:................................................

3. උපන් දිනය -:
වර්ෂය:.......................... මාසය:................................ දිනය:................................

ස්ත්‍රී / පුරුෂභාවය ස්ත්‍රී - 1 පුරුෂ - 0 ☐

5. ස්ථිර ලිපිනය (පැහැදිලි අකුරෙන්) – :
..............................................................................................................................................................
..............................................................................................................................................................

6. දුරකථන අංකය -: ස්ථාවර:.............................. ජංගම:.....................................

7. අධ්‍යාපන සුදුසුකම් -:

7.1. අ.පො.ස.(සා.පෙළ) විභාගය පිළිබඳ විස්තර :

I. විභාගයේ වර්ෂය හා මාසය -:.........................................................
II. විභාග අංකය -:.........................................................
III. සමත් වූ වර්ෂය -:.........................................................

| *විෂයය* | *ශ්‍රේණිය* | *විෂයය* | *ශ්‍රේණිය* |
|---|---|---|---|
| 1. | | 6. | |
| 2. | | 7. | |
| 3. | | 8. | |
| 4. | | 9. | |
| 5. | | 10. | |

7.2. අ.පො.ස.(උ.පෙළ) විභාගය පිළිබඳ විස්තර :

I. විභාගයේ වර්ෂය හා මාසය -:.........................................................
II. විභාග අංකය -:.........................................................
III. සමත් වූ වර්ෂය -:.........................................................

| *විෂයය* | *ශ්‍රේණිය* |
|---|---|
| 1. | |
| 2. | |
| 3. | |
| 4. | |

8. වෘත්තීය සුදුසුකම් -:

...............................................................................................................................................................
...............................................................................................................................................................
...............................................................................................................................................................

9. තනතුරට අදාළව ලබා ඇති පළපුරුද්ද -:

...............................................................................................................................................................
...............................................................................................................................................................
...............................................................................................................................................................

10. ඔබ කවරදාක හෝ චෝදනාවක් සඳහා උසාවියකින් වරදකරු වී තිබේ ද? ඔව්/ නැත -:

10.1. ඔව් නම් විස්තරය සඳහන් කරන්න :
...............................................................................................................................................................
...............................................................................................................................................................

11. තොරතුරු විමසිය හැකි ඥාතීන් නොවන පුද්ගලයින් -:

1. නම -:
තනතුර -:
ලිපිනය -:
දුරකථන අංකය -:

2. නම -:
තනතුර -:
ලිපිනය -:
දුරකථන අංකය -:

12. අයදුම්කරුගේ සහතිකය -:

(*අ*) මෙම අයදුම්පතෙහි මා විසින් සපයා ඇති තොරතුරු මා දන්නා තරමින් සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කර සිටිමි.
(*ආ*) මා විසින් කරනු ලැබ ඇති මෙම ප්‍රකාශය අසත්‍ය බව ඔප්පු වුවහොත් මා සේවයට බඳවා ගැනීමට නුසුදුස්සෙකු වන බව හා පත්වීම් ලැබීමෙන් පසු එසේ ඔප්පුවුවහොත් සේවයෙන් පහ කරනු ලැබීමට යටත් වන බව දන්වා සිටිමි.
(*ඇ*) මෙහි සඳහන් කිසිදු තොරතුරක් පසුව වෙනස් නොකරමි.

දිනය:.....................................

..........................................................,
අයදුම්කරුගේ අත්සන.

13. අයදුම්කරුගේ අත්සන සහතික කිරීම -:

මෙම අයදුම්පත් ඉදිරිපත් කරන ...........................................................................නමැති අය මා පෞද්ගලිකව හඳුනන බවත්, ඔහු /ඇය .......................................... දින මා ඉදිරිපිට දී ඉහත 12 ඡේදය යටතේ අත්සන් තබන ලද බවත් සහතික කරමි.

................................................................,
සහතික කරන අයගේ අත්සන.

දිනය -:
සහතික කරන අයගේ නම -:
තනතුර -:
ලිපිනය -:
(නිල මුද්‍රාවෙන් සනාථ කරන්න)

06 - 121

## ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

## ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ කළමනාකරණ සහකාර තාක්ෂණ ඛණ්ඩය - 3 සේවා ගණයේ III ශ්‍රේණියේ පෙර මුද්‍රණ සැලසුම්කරු, මුද්‍රණ කාර්මික හා මුද්‍රණ නිමැවුම්කරු තනතුරුවලට විවෘත බඳවා ගැනීම සඳහා අයදුම්පත් කැඳවීම

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ පුරප්පාඩු වී ඇති කළමණාකරණ සහකාර තාක්ෂණ ඛණ්ඩය -3 සේවා ගණයට අයත් III ශ්‍රේණියේ පෙර මුද්‍රණ සැලසුම්කරු, මුද්‍රණ කාර්මික හා මුද්‍රණ නිමැවුම්කරු තනතුරුවල පුරප්පාඩු විවෘත බඳවා ගැනීමේ පදනමින් පිරවීම සඳහා අනුමත බඳවා ගැනීමේ පටිපාටිය අනුව අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට මෙම නිවේදනයේ මතු දක්වා ඇති සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ

**අයදුම්පත් කැඳවන අවසාන දිනය 2026.07.10 වේ.**

තනතුරුවල පුරප්පාඩු ගණන පහත පරිදි වේ.

| | |
|---|---|
| පෙර මුද්‍රණ සැලසුම්කරු | 01 |
| මුද්‍රණ කාර්මික | 02 |
| මුද්‍රණ නිමැවුම්කරු | 01 |

1.0 සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි:

1.1 රාජ්‍ය සේවයේ පත්කිරීම් පාලනය කෙරෙන පොදු කොන්දේසිවලට ද, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 2310/29 දරන සහ 2022.12.14 දිනැති අතිවිශේෂ *ගැසට්* පත්‍රයේ පළ වූ රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීතිවලට ද, ආයතන සංග්‍රහයේ විධිවිධානවලට ද, මුදල් රෙගුලාසි සහ ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ කළමනාකරණ සහකාර තාක්ෂණ ඛණ්ඩය 3- සේවා ගණය සඳහා වූ බඳවා ගැනීමේ පටිපාටියේ විධිවිධාන සහ ඒවාට දැනට ක්‍රියාත්මකකර ඇති හා මින් මතු කෙරෙන සංශෝධනවලට ද යටත්ව තෝරාගනු ලබන අයදුම්කරුවන් ඉහත තනතුරුවලට පත් කරනු ලැබේ. මෙම තනතුරු ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවට සීමා වූ තනතුරු වේ.

1.2 මෙම තනතුරු ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. තව ද පත්වීම්ලාභීන් වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට/ වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක විය යුතුය. රජය විසින් වරින්වර නියම කරනු ලබන ආකාරයට පත්වීම්ලාභීන් ඒ සඳහා දායක මුදල් ගෙවිය යුතු ය.

1.3 මෙම පත්වීම් අවුරුදු තුනක පරිවාස කාලයකට යටත්ය. තනතුරට පත්වී වසර තුනක් (03) ඇතුළත ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ කළමනාකරණ සහකාර තාක්ෂණ ඛණ්ඩය - 3 සේවා ගණයේ බඳවා ගැනීමේ පටිපාටියේ ඇමුණුම 1හි දැක්වෙන පරිදි 1 වන කාර්යක්ෂමතා කඩ ඉම් පරීක්ෂණය සමත් විය යුතු ය.

1.4 පත්වීම්ලාභීන් රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 18/2020ට අනුව තනතුරට පත් කරනු ලබන දින සිට වසර පහක් ඇතුළත නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය ලබා ගත යුතු ය.

1.5 තමා වෙත පිරිනමන ලද තනතුරේ රාජකාරි නියමිත දිනයේදී භාර ගැනීමට අපොහොසත් වන හෝ මගහරින පත්වීම් ලාභියෙකුගේ පත්වීම අවලංගු කරනු ලැබිය හැකි ය.

2.0 තනතුරුවලට අදාළ වැටුප් කේතය සහ වැටුප් පරිමාණය :

2.1 වැටුප් කේතය : MT 01- 2025

2.2 වැටුප් පරිමාණය : රු. 50,090-10 X 540-11 X 630-10X 1,010-10X 1,190 - රු. 84,420/- ක වැටුප් පරිමාණයක් මෙම තනතුරට හිමි වේ.

2025.03.25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 10/2025 අනුව අදාළ තනතුරට පත්කිරීමේ දී ගෙවන වැටුප තීරණය වේ.

3.0. තනතුරුවලට පැවරෙන කාර්යයන්:

**පෙර මුද්‍රණ සැලසුම්කරු :**

- පිටු ලේ - අවුට් කිරීම
- ප්‍රොසෙස් කැමරා වැඩ
- ඡායාපටල යොදා සැලසුම් කිරීම හා පිටු ලේ-අවුට් කිරීම
- රිප් කිරීම
- ඉමේජ් සෙටින් කිරීම
- ප්ලේට් සෑදීම
- පොලිමර් ප්ලේට් සෑදීම
- ඩිජිටල් මුද්‍රණ යන්ත්‍ර ක්‍රියා කරවීම

**මුද්‍රණ කාර්මික :**

- ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්කමේන්තුවේ මුද්‍රණ අංශයේ ඇති සියලුම මුද්‍රණ යන්ත්‍රවල දෝෂ හඳුනා ගැනීම හා සුළු අලුත්වැඩියා සිදු කිරීම.

**මුද්‍රණ නිමැවුම්කරු :**

- නැමීම, ගැදර් කිරීම, ඉන්සට් කිරීම, වයර් ගැසීම, සෙක්ෂන් මැසීම හා පර්ෆෙක්ට් බයින්ඩින් කිරීම, කැපීම, කේස් කවර සෑදීම, ලෙජර් සෑදීම, නැවත බැඳීම, පොයිල් කිරීම.

4.0. බඳවා ගැනීමේ සුදුසුකම් :

4.1 අධ්‍යාපන සුදුසුකම් :

සිංහල / දෙමළ / ඉංග්‍රීසි භාෂාව, ගණිතය සහ තවත් විෂයයන් දෙකකට සම්මාන සාමාර්ථයන් සහිතව එක් වරකදී විෂයයන් හයකින් (06) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත් වී තිබීම;

*හෝ*

ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) තුන (3) හෝ ඊට ඉහළ මට්ටමක සුදුසුකමක් ලබා තිබීම.

4.2 වෘත්තීය සුදුසුකම් :

*පෙර මුද්‍රණ සැලසුම්කරු :*

පිළිගත් ආයතනයක පෙර මුද්‍රණ ශිල්පය පිළිබඳ අවම වශයෙන් වසර තුනක පූර්ණ කාලීන පාඨමාලාවක් හදාරා සහතිකය ලබා තිබීම හෝ පිළිගත් ආයතනයක පෙර මුද්‍රණ ශිල්පය පිළිබඳ වසර හතර (04) ක වෘත්තීය පළපුරුද්දක් ලබා තිබීම;

*මුද්‍රණ කාර්මික :*

පිළිගත් ආයතනයක මුද්‍රණ කාර්මික ක්ෂේත්‍රයට අදාළව වැද්දුම් ශිල්පය / විදුලි කාර්මික ශිල්පය පිළිබද අවම වශයෙන් වසර තුනක පූර්ණ කාලීන පාඨමාලාවක් හදාරා සහතිකය ලබා තිබීම හෝ (NVQ) හතර (04) මට්ටමේ ප්‍රවීණතා සහතිකය ලබා තිබීම;

*මුද්‍රණ නිමැවුම්කරු :*

පිළිගත් ආයතනයක මුද්‍රණ නිමැවුම්කරු ක්ෂේත්‍රයට අදාළව අවම වශයෙන් වසර තුනක පූර්ණ කාලීන පාඨමාලාවක් හදාරා සහතිකය ලබා තිබීම හෝ (NVQ) හතර (04) මට්ටමේ ප්‍රවීණතා සහතිකය ලබා තිබීම.

4.3 කායික සුදුසුකම් : සෑම අපේක්ෂකයෙකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්, තනතුරේ රාජකාරි ඉටුකිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවකින් යුක්ත විය යුතු ය.

4.4 වෙනත් සුදුසුකම්

1. ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතු ය.
2. අයදුම්කරුවන් විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතු ය.
3. තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍යවන සුදුසුකම් අයදුම්පත් කැඳවීමේ අවසන් දිනට සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතු ය.

*සටහන :* තනතුරට ලබා ඇති පළපුරුද්ද හා සුදුසුකම් පිළිගත හැකි සහතික මගින් සනාථ කළ යුතු ය. එම සුදුසුකම් අයදුම්පත් කැඳවන අවසාන දිනට වලංගු විය යුතු ය.

4.5 වයස : අවුරුදු 18ට නොඅඩු හා අවුරුදු 35 ට නොවැඩි විය යුතු ය.

5.0 බඳවා ගැනීමේ ක්‍රමය :

ජනලේඛන හා සංඛ්‍යාලේඛන අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් පත් කළ සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මගින් පවත්වනු ලබන යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත අයදුම්කරුවන්ගේ කුසලතා අනුපිළිවෙලින් එක් එක් තනතුරට පත් කරනු ලැබේ. යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය සඳහාවන විස්තරාත්මක ලකුණු පරිපාටිය පහත උපලේඛනයේ දැක්වේ.

6.0. අයදුම්පත් ඉදිරිපත් කිරීම :

***සටහන:*** *මෙම ගැසට්* නිවේදනයේ සඳහන් තනතුරු සඳහා අයදුම්පත් ඉදිරිපත් කිරීමේ දී ඉල්ලුම් කරන තනතුරට අදාළ සුදුසුකම් සම්පූර්ණ කර ඇත්නම් පමණක් අයදුම් කිරීමට කටයුතු කරන්න.

(I) **අයදුම්පත් 2026.07.03 දිනට හෝ එදිනට ප්‍රථම "අධ්‍යක්ෂ ජනරාල්, ජනලේඛන හා සංඛ්‍යාලේඛන**

**දෙපාර්මේන්තුව, අංක 306/71, පොල්දූව පාර, බත්තරමුල්ල" යන** ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. එදිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

(II) ඉදිරිපත් කළ යුතු අයදුම්පතේ ආදර්ශ ආකෘතියක් මෙම නිවේදනය අවසානයේ දැක්වේ. අයදුම්කරුවන් ඔවුන්ගේ අයදුම්පත් A4 ප්‍රමාණයේ කඩදාසියක සකස්කර පිළියෙළ කරගත යුතු වේ.

නියමිත ආදර්ශ ආකෘතියට අනුකූල නොවන හා අසම්පූර්ණ අයදුම්පත් කිසිඳු දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරන බැවින්, අයදුම්පත යොමු කිරීමට ප්‍රථම එය කැඳවීම් නිවේදනයේ සඳහන් ආදර්ශ අයදුම්පතට අනුකූල ද යන්න හා සියලු තොරතුරු ඇතුළත්කොට අයදුම්පත නිවැරදිව සම්පූර්ණ කර තිබේද යන්න පිළිබඳව අයදුම්කරු විසින් විමසා බලා තහවුරු කර ගත යුතු වේ.

(III) අයදුම්පත බහා එවන කවරයේ ඉහළ වම් කෙළවරේ "කළමනාකරණ සහකාර තාක්ෂණ බණ්ඩය 3 සේවා ගණයේ III ශ්‍රේණියේ තනතුරුවලට බඳවා ගැනීම" ලෙස සඳහන්කර එවිය යුතු ය. තනතුරු කිහිපයක් සඳහා අයදුම් කරන්නේ නම් වෙන් වෙන් වශයෙන් අයදුම්පත් ඉදිරිපත් කළ යුතු ය.

(IV) අයදුම්පතේ අයදුම්කරුගේ අත්සන සහතික කර තිබිය යුතු ය. කිසියම් ආයතනයකින් සම්මුඛ පරීක්ෂණයට ඉල්ලුම්කරන අයදුම්කරුවෙකු තම අත්සන ආයතන ප්‍රධානියා හෝ ඔහු විසින් බලය පවරන ලද නිලධාරියෙකු ලවා ද, එසේ නොවන අයදුම්කරුවෙකු තම අත්සන කොට්ඨාසයේ ග්‍රාම නිලධාරිවරයෙකු හෝ සාමදාන විනිශ්චයකාරවරයෙකු හෝ ලවා සහතික කරවා ගත යුතු ය.

(V) මේ සමග ඇති ආදර්ශ අයදුම්පතේ ආකෘතියට අනුකූල නොවන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයදුම්පත් තැපෑලේදී නැතිවීම හෝ ප්‍රමාද වීම ගැන කිසිඳු පැමිණිල්ලක් භාර ගනු නොලැබේ.

7.0 යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයට පෙනී සිටීම

(I) *ගැසට්* නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති අය පමණක් ඉල්ලුම්කර ඇතැයි යන පූර්ව නිගමනය මත නිවේදනයේ සඳහන් වයස් සීමාව තුළවන, අයදුම්පත් භාරගන්නා අවසාන දිනට හෝ එදිනට පෙර නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත් යොමුකොට ඇති අයදුම්කරුවන් වෙත ජනලේඛන හා සංඛ්‍යාලේඛන අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයට පෙනී සිටීමට කැඳවීම් ලිපි නිකුත් කරනු ඇත.

(II) යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයට පෙනී සිටීම සඳහා කැඳවීම් ලිපියක් නිකුත් කිරීම අයදුම්කරු මෙම තනතුර සඳහා සුදුසුකම් සපුරා ඇති බව පිළිගැනීමක් ලෙස සලකනු නොලැබේ.

(III) අයදුම්කරුවන් වෙත කැඳවීම් ලිපි නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් නිවේදනයක් https://www.statistics.gov.lk/ වෙබ් අඩවියේ ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් පළ කරනු ඇත.නිවේදනය පළවී දින 02 ක් හෝ 03 ක් ගතවූ පසුවත් තම කැඳවීම් ලිපිය නොලද අපේක්ෂකයෙකු වේ නම්, දැන්වීමේ සඳහන් පරිදි ඒ පිළිබඳව ජන ලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ ආයතන අංශයෙන් විමසිය යුතු ය. එසේ විමසීමේදී අයදුම්කරු තමා විසින් ඉල්ලුම් කරන ලද තනතුරේ නම, අයදුම්කරුගේ සම්පූර්ණ නම, ජාතික හැඳුනුම්පත් අංකය හා ලිපිනය නිවැරදිව සඳහන් කළ යුතු ය. අයදුම්කරු කොළඹින් බැහැර පදිංචිකරුවෙකු නම්, එම විස්තර සමග ෆැක්ස් හෝ ඊමේල් මගින් කැඳවීම් ලිපියේ පිටපතක් කඩිනමින් ලබා ගැනීමට හැකි අයදුම්කරුගේ ෆැක්ස් අංකයක් හෝ ඊමේල් ලිපිනයක් සඳහන් කරමින් ඉල්ලීම් ලිපියක් දැන්වීමේ සඳහන් ෆැක්ස් අංකය හෝ ඊමේල් ලිපිනය වෙත යොමුකර විමසා සිටීම වඩාත් ඵලදායී වනු ඇත. එසේ විමසීමේ දී දෙපාර්තමේන්තුව විසින් විමසා සිටින කිසියම් තොරතුරක් සනාථ කිරීම සඳහා තමා ළඟ තබාගත් අයදුම්පතේ පිටපත හා අයදුම්පත තැපැල් කිරීමේදී ලියාපදිංචි කළ කුවිතාන්සිය සූදානමින් තබා ගැනීම ද ප්‍රයෝජනවත් වනු ඇත.

(IV) යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය පැවැත්වීම සම්බන්ධයෙන් ජනලේඛන හා සංඛ්‍යාලේඛන අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් පනවනු ලබන නීතිරීති වලට යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයට සහභාගීවන අපේක්ෂකයන් යටත් වේ. එම නීතිරීති උල්ලංඝනය කළහොත්, ජනලේඛන හා සංඛ්‍යාලේඛන අධ්‍යක්ෂ ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත්වීමට ඔහුට හෝ ඇයට සිදුවනු ඇත.

8.0 අයදුම්කරුවන්ගේ අනන්‍යතාවය

අපේක්ෂකයන් විසින් යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයේ දී තමන්ගේ අනන්‍යතාවය සහතික කිරීම සඳහා පහත සඳහන් ලියවිලිවලින් එකක් සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය වෙත ඉදිරිපත් කළ යුතු ය.

I. ජාතික හැඳුනුම්පත,
II. වලංගු විදේශ ගමන් බලපත්‍රය,
III. වලංගු ශ්‍රී ලාංකික රියදුරු බලපත්‍රය.

එමෙන්ම යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයට සහභාගීවන අපේක්ෂකයන් අනන්‍යතාවය තහවුරුකර ගත හැකිවන පරිදි මුහුණ හා දෙකන් ආවරණය කිරීමකින් තොරව පැමිණිය යුතු ය. එසේ තම අනන්‍යතාවය සනාථ කිරීම ප්‍රතික්ෂේප කරන අපේක්ෂකයන් යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය සඳහා ඇතුළත්කර නොගැනේ. තව ද සම්මුඛ පරීක්ෂණය අවසන් වී ඉන් පිටවන තෙක් අදාළ බලධාරීන්ට අයදුම්කරු හඳුනාගත හැකිවන පරිදි මුහුණ හා දෙකන් ආවරණය කිරීමෙන් තොරව සිටිය යුතු ය.

9.0 සාවද්‍ය තොරතුරු සැපයීම

ඔබ විසින් එවන ලද අයදුම්පතේ සඳහන්කර ඇත්තා වූ යම් තොරතුරක් අසත්‍ය හෝ වැරදි බව බඳවා ගැනීමට පෙර අනාවරණය වුවහොත් ඔබගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ. එබඳු අසත්‍ය හෝ වැරදි තොරතුරක් බඳවා ගැනීමෙන් පසුව අනාවරණය වුවහොත් ඊට අදාළ නීති ක්‍රියාමාර්ගයන්ට යටත්ව රජයේ සේවයෙන් පහ කිරීමට කටයුතු කරනු ලැබේ.

10.0 ඉහත දැක්වෙන පුරප්පාඩු අතුරින් බඳවා ගැනීම් සිදු කළ යුතු පුරප්පාඩු ගණන ජනලේඛන හා සංඛ්‍යාලේඛන අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් තීරණය කරනු ඇත.

11.0 සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි මාධ්‍යයෙන් පළවන මෙම නිවේදනයේ භාෂා පාඨ අතර කිසියම් නොගැළපීමක් හෝ අනනුකූලතාවයක් ඇති බව පෙනී යන්නේ නම් එවැනි අවස්ථාවක සිංහල මාධ්‍ය නිවේදනය අනුව කටයුතු කරනු ලැබේ

**කේ.එම්. ඩී. එස්.ඩී.කරුණාරත්න,**
අධ්‍යක්ෂ ජනරාල්,
ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව.

2026 මැයි මස 22 දින,
ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ දී ය.

**උපලේඛනය**

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ කළමනාකරණ සහකාර තාක්ෂණ ඛණ්ඩය -3 සේවා ගණයේ III ශ්‍රේණියේ පෙර මුද්‍රණ සැලසුම්කරු, මුද්‍රණ කාර්මික හා මුද්‍රණ නිමැවුම්කරු තනතුරුවලට විවෘත බඳවා ගැනීම යටතේ බඳවා ගැනීම.

යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය - ලකුණු පරිපාටිය

| *ලකුණු ලබාදෙනු ලබන ප්‍රධාන ශීර්ෂ* | | *උපරිම ලකුණු ප්‍රමාණය* |
|---|---|---|
| 1. අතිරේක අධ්‍යාපන සුදුසුකම් :<br>අ.පො.ස. (උ.පෙළ) විභාගය සමත් නම්, | ලකුණු 05 ක් | 10 |
| අ.පො.ස. (උ.පෙළ) ගණිතය විෂයයක් හෝ භෞතික විද්‍යාව හෝ රසායන විද්‍යාව හෝ ඉංජිනේරු / තොරතුරු හා සන්නිවේදන (සිවිල් / යාන්ත්‍රික / විදුලි / ඉලෙක්ට්‍රොනික තාක්ෂණවේදය හෝ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ හෝ තාක්ෂණය සඳහා විද්‍යාව විෂය සමත්වීම; | ලකුණු 03 ක් | |
| අ.පො.ස. (සා. පෙළ) විද්‍යාව හෝ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය හෝ නිර්මාණ කරණය හා තාක්ෂණවේදය හෝ යාන්ත්‍රික / විදුලි / ඉලෙක්ට්‍රොනික තාක්ෂණවේදය සඳහා විශිෂ්ට සාමාර්ථය; | ලකුණු 03 ක් | |

| | ලකුණු ලබාදෙනු ලබන ප්‍රධාන ශීර්ෂ | | උපරිම ලකුණු ප්‍රමාණය |
|---|---|---|---|
| | අ.පො.ස. (සා.පෙළ) විද්‍යාව හෝ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය හෝ නිර්මාණ කරණය හා තාක්ෂණවේදය හෝ යාන්ත්‍රික / විදුලි / ඉලෙක්ට්‍රොනික තාක්ෂණවේදය සඳහා සාමාර්ථය;<br><br>අ.පො.ස. (සා.පෙළ) ගණිතය සඳහා විශිෂ්ඨ සාමාර්ථය. | ලකුණු 02 ක්<br><br>ලකුණු 03 ක් | |
| 2. | අතිරේක වෘත්තීය සුදුසුකම් :<br>**පෙර මුද්‍රණ සැලසුම්කරු**<br>පිළිගත් ආයතනයක පෙර මුද්‍රණ ශිල්පය සම්බන්ධයෙන් හදාරා ඇති,<br>• වසරකට නොඅඩු පුහුණු පාඨමාලාවක් සඳහා<br>• මාස 06 කට නොඅඩු පුහුණු පාඨමාලාවක් සඳහා<br>**මුද්‍රණ කාර්මික**<br>පිළිගත් ආයතනයක මුද්‍රණ කාර්මික ශිල්පය සම්බන්ධයෙන් හදාරා ඇති,<br>• වසරකට නොඅඩු පුහුණු පාඨමාලාවක් සඳහා<br>• මාස 06 කට නොඅඩු පුහුණු පාඨමාලාවක් සඳහා<br>**මුද්‍රණ නිමැවුම්කරු**<br>පිළිගත් ආයතනයක මුද්‍රණ නිමැවුම්කරණය සම්බන්ධයෙන් හදාරා ඇති,<br>• වසරකට නොඅඩු පුහුණු පාඨමාලාවක් සඳහා<br>• මාස 06 කට නොඅඩු පුහුණු පාඨමාලාවක් සඳහා | <br><br><br>ලකුණු 05 බැගින්<br>ලකුණු 03 බැගින්<br><br><br>ලකුණු 05 බැගින්<br>ලකුණු 03 බැගින්<br><br><br>ලකුණු 05 බැගින්<br>ලකුණු 03 බැගින් | 25 |
| 3. | අතිරේක පළපුරුද්ද<br>(පළපුරුද්ද සඳහා පූර්ණ වසරකට ලකුණු 12 බැගින් උපරිම වසර වසර 05 ක් සඳහා ලබා දෙනු ලැබේ.)<br>**පෙර මුද්‍රණ සැලසුම්කරු**<br>• පිළිගත් ආයතනයක පෙර මුද්‍රණ සැලසුම්කරු වශයෙන් සේවා පළපුරුද්ද සඳහා<br>**මුද්‍රණ කාර්මික**<br>• පිළිගත් ආයතනයක පෙර මුද්‍රණ සැලසුම්කරු වශයෙන් සේවා පළපුරුද්ද සඳහා<br>**මුද්‍රණ නිමැවුම්කරු**<br>• පිළිගත් ආයතනයක පෙර මුද්‍රණ සැලසුම්කරු වශයෙන් සේවා පළපුරුද්ද සඳහා | | 60 |
| **4.** | **සම්මුඛ පරීක්ෂණයේදී දක්වන ලද කුසලතාවය** | | **05** |
| **5.** | එකතුව | | **100** |

**ආදර්ශ අයදුම්පත්‍රය**

(කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා පමණි)

**ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ කළමනාකරණ සහකාර තාක්ෂණ ඛණ්ඩය - 3 සේවා ගණයේ III ශ්‍රේණියේ පෙර මුද්‍රණ සැලසුම්කරු, මුද්‍රණ කාර්මික සහ මුද්‍රණ නිමැවුම්කරු තනතුරුවලට විවෘත ධාරාව යටතේ බඳවා ගැනීම සඳහා වන අයදුම්පත්‍රය**

සම්මුඛ පරීක්ෂණයට පෙනී සිටීමට අපේක්ෂිත මාධ්‍ය
(සිංහල - 2/ දෙමළ - 3)

(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

ඉල්ලුම් කරන තනතුර ..................................................

**01.** 1.1 **සම්පූර්ණ නම** -: ........................................................................................................................
........................................................................................................................
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

1.2 මුලකුරු අගට යොදා මුලකුරු සමග නම -: ........................................................................................
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) උදාහරණ : SUNIL, A.B.

1.3 සම්පූර්ණ නම -: ........................................................................................................................
(සිංහලෙන්/දෙමළෙන්) ........................................................................................................................

**02.** ස්ථිර ලිපිනය :-

2.1 (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) ........................................................................................................

2.2 (සිංහල/දෙමළ) ........................................................................................................

2.3 දුරකථන අංකය :

ජංගම දුරකථන

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | |

ස්ථාවර දුරකථන

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | |

**03.** 3.1 ස්ත්‍රී / පුරුෂ භාවය -:

ස්ත්‍රී - 1
පුරුෂ - 0 (අදාළ අංකය කොටුව තුළ ලියන්න)

**04.** ජාතික හැඳුනුම්පත් අංකය

| | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | | | |

**05.** උපන් දිනය

වර්ෂය : | | | | | මාසය : | | | දිනය : | | |

**06.** **අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වයස (2026.07.03 දිනට)**

අවුරුදු : | | | මාස : | | | දින : | | |

**07.** විවාහක/ අවිවාහක බව :

**08.** ශ්‍රී ලංකාවේ පුරවැසියෙක් ද යන වග : ..........................................................................................................................

**09.** අධ්‍යාපන සුදුසුකම් :

අ.පො.ස. (සා.පෙළ)
විභාග අංකය : .............................................. පෙනී සිටි වසර ..........................................

1. .............................................................................. 6. ..............................................................................
2. .............................................................................. 7. ..............................................................................
3. .............................................................................. 8. ..............................................................................
4. .............................................................................. 9. ..............................................................................
5. .............................................................................. 10. ..............................................................................

අ.පො.ස. (උ.පෙළ)
විභාග අංකය : .............................................. පෙනී සිටි වසර ..........................................

1. .............................................................................. 3. ..............................................................................
2. .............................................................................. 4. ..............................................................................

**10.** **වෘත්තීය සුදුසුකම් :**

| පාඨමාලාවේ නම | ආයතනය | NVQ මට්ටම | කාල සීමාව | වලංගු දිනය |
|---|---|---|---|---|
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |

**11.** **පළපුරුද්ද :**

| ආයතනය | සේවා කාලය |
|---|---|
| | |
| | |

**12.** වෙනත් සුදුසුකම් :

..........................................................................................................................................................
..........................................................................................................................................................
..........................................................................................................................................................
..........................................................................................................................................................

**13. ඔබ කවරදාක හෝ කවර චෝදනාවක් සඳහා හෝ උසාවියකින් වරදකරු කරනු ලැබ තිබේ ද? එසේ නම්, ඒ පිළිබඳ විස්තර සඳහන් කරන්න**

.................................................................................................................................................................................

**14. අයදුම්කරුගේ සහතිකය :**

ඉහත දක්වා ඇති තොරතුරු සත්‍ය හා නිවැරදි බව මෙයින් සහතික කරමි. තව ද මෙහි දැක්වෙන යම් කරුණක් අසත්‍ය බව සනාථ වුවහොත් මා මෙම තනතුර සඳහා සුදුස්සෙකු නොවන බව ද, තනතුරෙන් ඉවත් වීමට සිදු වන බව ද මා හොඳාකාරව ම දන්නා බව ද මෙයින් ප්‍රකාශ කරමි.

............................................,
අයදුම්කරුගේ අත්සන.

දිනය -:...............................

**15. අයදුම්කරුගේ අත්සන සහතික කිරීම :**

ඉහත නම සඳහන් ......................................................................................... මහතා/මහත්මිය/මෙනවිය මා හොඳින් දන්නා බවත්, අද දින මා ඉදිරිපිට දී ඔහුගේ/ ඇයගේ අත්සන තබන ලද බවත් සහතික කරමි.

............................................,
සහතික කරන්නාගේ අත්සන.
(ග්‍රාම නිලධාරි/ සාමදාන විනිශ්වයකාර)

නම -:...............................
පදවි නාමය -:...............................
ලිපිනය -:...............................
දිනය -:...............................

**16. දැනටමත් රජයේ සේවයේ නියුක්ත අයදුම්කරුවන් පමණක් තම දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ පහත සඳහන් සහතිකය සමග අයදුම්පත් ඉදිරිපත් කළ යුතු ය.**

ඉහත විස්තර සඳහන් ......................................................................................... මහතා/මහත්මිය/මෙනවිය මෙම ආයතනයේ සේවය කරන බවත්, ඔහු/ඇය විසින් සපයා ඇති තොරතුරු නිවැරදි බවත්, මෙම තනතුර සඳහා තෝරාගනු ලැබුවහොත් මෙම ආයතනයේ සේවයෙන් නිදහස් කළ හැකි/නොහැකි බවත් සහතික කරමි.

.........
...........................................................,
දෙපාර්තමේන්තු /ආයතන ප්‍රධානියාගේ අත්සන
හා නිල මුද්‍රාව.

නම :- ..............................................................................................
පදවි නාමය :-...............................................................................................
ලිපිනය :-..............................................................................................
දිනය :-.......................................................................................

නිල මුද්‍රාව

06 - 127

**අවලංගු කිරීම**

රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

**මහනුවර දිස්ත්‍රික්කය**

උප්පැන්න, මරණ හා විවාහ, අතිරේක විවාහ රෙජිස්ට්‍රාර් තනතුරු සඳහා අයදුම්පත් කැඳවීමේ දැන්වීම

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 2423 හා 2025.02.07 දිනැති *ගැසට්* පත්‍රයේ මා විසින් පළකරන ලද පහත සඳහන් මහනුවර දිස්ත්‍රික්කයේ උප්පැන්න, මරණ හා විවාහ, අතිරේක විවාහ රෙජිස්ට්‍රාර් තනතුරු සඳහා ඉල්ලුම්පත් කැඳවීමේ නිවේදන පමණක් අයදුම්පත් කැඳවීම අවලංගු කරමි.

**උපලේඛනය**

| *දිස්ත්‍රික්කය* | *ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය* | *ඉල්ලුම්පත් කැඳවන කොට්ඨාසය හා තනතුර* |
|---|---|---|
| මහනුවර | උඩපළාත | කඳුකර ඉහළ නැගෙනහිර කොට්ඨාසයේ උප්පැන්න, මරණ හා උඩපළාත කොට්ඨාසයේ විවාහ (උඩරට/ සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් ධුරය |
| මහනුවර | යටිනුවර | උඩුනුවර - යටිනුවර කොට්ඨාසයේ අතිරේක විවාහ (උඩරට/ සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් ධුරය |

**එස්. ජලදීපන්,**
රෙජිස්ට්‍රාර් ජනරාල්.

2026 මැයි මස 26 දින,
අංක 234/ඒ3, බත්තරමුල්ල, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

06 - 145

---

**සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය**

වෛද්‍ය කර්මය සඳහා වූ පරිපූරක වෘත්තීන්ගේ සේවාවේ ඖෂධවේදී තනතුරේ අනුස්ථාපන හා සමායෝජන පාඨමාලාව සඳහා උපාධිධාරීන් බඳවා ගැනීම - 2026

1. අමප/26/0380/802/002 - I හා 2026/03/03 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණයට අනුව ඖෂධවේදී තනතුරේ පුරප්පාඩු 164ක් සඳහා සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශයේ වෛද්‍ය කර්මය සඳහා වූ පරිපූරක වෘත්තීන්ගේ සේවාවේ ඖෂධවේදී තනතුරේ අනුස්ථාපන හා සමායෝජන පාඨමාලාව සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයක් හෝ වෙනත් උපාධි ප්‍රදානය කිරීමේ ආයතනයක් මඟින් ප්‍රදානය කරන උපාධියක් ලබා ඇති පහත සුදුසුකම් ලත් ශ්‍රී ලංකා පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

2. තනතුරට අදාළ අධ්‍යාපන හා වෙනත් විශේෂ සුදුසුකම් :-

   (*අ*) අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයෙන් රසායන විද්‍යාව විෂයට සම්මාන සාමාර්ථයක් සහිතව සංයුක්ත ගණිතය, ජීව විද්‍යාව, භෞතික විද්‍යාව, කෘෂි විද්‍යාව, යන විෂයයන් අතුරින් විෂයන් දෙකක් එකවර සමත්වීම;

   (*ආ*) අවම ශාස්ත්‍රීය අගය 120 කින් යුත් ඖෂධවේදී (B.Pharm)/ විද්‍යාවේදී (ඖෂධවේදී) (B.Sc. Pharmacy) උපාධිය සම්පූර්ණ කිරීම;

   (*ඇ*) ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ ලියාපදිංචිය ලබා තිබිය යුතු යි.

3. අනෙකුත් පොදු සුදුසුකම් :-

   (*අ*) සෑම අපේක්ෂකයෙකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට බැඳී සිටිය යුතු ය.

   (*ආ*) තනතුරේ රාජකාරි ඉටු කිරීමට ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතු ය.

   (*ඇ*) ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතු ය.

(ඈ) අයදුම්කරුවන් විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතු ය.

(ඉ) 2026.07.08 දිනට වයස අවුරුදු 18 ට නොඅඩු, වයස අවුරුදු 35ට නොවැඩි විය යුතු යි.

(ඊ) අදාළ උපාධිය බලපැවැත්වෙන දිනය අයදුම්පත් භාරගන්නා අවසාන දිනට පෙර දිනයක් විය යුතු යි.

(උ) අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ සුදුසුකම් සම්පූර්ණ කර තිබිය යුතු බවට සඳහන් කරනු ලබන දිනට සියලු සුදුසුකම් සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතු ය. එමෙන්ම, අයදුම්කරුවන් විසින් සුදුසුකම් සනාථ කිරීම සඳහා අදාළ සහතිකවල පිටපත් අයදුම්පත්‍රය සමඟ ඉදිරිපත් කළ යුතු ය.

4. අයදුම් කළ යුතු ක්‍රමය : -

(අ) මේ සමඟ ඇති ආදර්ශ අයදුම්පතේ ආකෘතිය අනුව ස්වකීය අයදුම්පත සකස් කළ යුතු අතර ඒ සඳහා A4 ප්‍රමාණයේ කඩදාසි භාවිත කළ යුතු ය. (අංක 01 සිට 08 දක්වා පළමු පිටුවේ ද, 09 සිට 13 දක්වා දෙවන පිටුවේ ද, 14 සිට 15 දක්වා තුන්වන පිටුවේ ද වන සේ අයදුම්පත සකස් කරගත යුතු ය.)

(ආ) අයදුම්පතේ "ලදුපත" ස්ථානයේ, ලංකා බැංකුව, තැප්‍රොබේන් ශාඛාවේ අංක 7041318 දරන "සෞඛ්‍ය ලේකම් විභාග ගාස්තු රැස්කිරීම" යන ගිණුමට රු.1,000.00 බැරකර එම ලදුපත නොගැලවෙන සේ ඇලවිය යුතු ය. (ලදුපත ඇලවීමට පෙර එහි පිටපතක් තබා ගන්න)

(ඇ) අයදුම්පත්‍රයේ අයදුම්කරුගේ අත්සන රජයේ විදුහලක විදුහල්පතිවරයෙකු හෝ සාමදාන විනිශ්චකාරවරයෙකු හෝ දිවුරුම් කොමසාරිස්වරයෙකු හෝ නීතිඥවරයෙකු හෝ ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු හෝ ත්‍රිවිධ හමුදාවේ අධිකාරි බලයලත් නිලධාරියෙකු හෝ පොලිස් සේවයේ *ගැසට්* කරන ලද තනතුරක් දරන නිලධාරියෙකු හෝ රු. 854,880.00 ට වැඩි වාර්ෂික ඒකාබද්ධ වැටුපක් ලබන රාජ්‍ය හෝ පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර මාණ්ඩලික ශ්‍රේණියේ තනතුරක් දරන නිලධාරියෙකු හෝ විසින් සහතික කළ යුතු ය.

(ඈ) නිසි පරිදි සම්පූර්ණ කරන ලද අයදුම්පත් 9x4 ප්‍රමාණයේ ලියුම් කවරයක බහා එම කවරයේ ඉහළ කෙළවරේ "වෛද්‍ය කර්මය සඳහා වූ පරිපූරක වෘත්තීන්ගේ සේවාවේ ඖෂධවේදී තනතුරේ අනුස්ථාපන හා සමායෝජන පාඨමාලාව සඳහා උපාධිධාරීන් බඳවා ගැනීම - 2026" වශයෙන් හා අදාළ උපාධිය හා අධ්‍යයන වර්ෂය ද සඳහන් කර 2026.07.08 දිනට පෙර අධ්‍යක්ෂ (පාලන) 02, සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය, අංක 106, ඩඩ්ලි සේනානායක මාවත, කොළඹ 08 යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය.

5. රජයේ හෝ අර්ධ රාජ්‍ය ආයතනවල නිලධාරින්ගේ අයදුම්පත්, ඔවුන්ගේ දෙපාර්තමේන්තුවේ ප්‍රධානියා මගින් එවිය යුතු ය.

6. අයදුම්පත් ලැබුණු බව දන්වා එවනු නොලබන අතර නියමිත දිනට පසු ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. මෙම නිවේදනයේ දැක්වෙන නියමයන්ට හා අදාළ ආකෘතියට අනුකූල නොවන අයදුම්පත් දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

7. පුහුණු පාඨමාලාවට අදාළව ඉහතින් දක්වා ඇති උපාධිධාරින්ගේ උපාධිය බලපවත්වන දිනය (Effective Date) හා උපාධියේ ශ්‍රේණියේ සාමාන්‍ය අගය (GPA) පදනම් කරගෙන කුසලතා ලේඛනය සකස් කර පුහුණු පාඨමාලාවට සුදුස්සන් තෝරාගනු ලැබේ. මෙම උපාධිධාරින් බඳවා ගැනීමට අදාළව මීට පෙර නිකුත් කර ඇති *ගැසට්* නිවේදනයේ අයදුම්පත් ඉදිරිපත් කිරීමේ අවසන් දිනය වූ 2019.06.14 දිනට පසුව උපාධිය ලබා ඇති අයදුම්කරුවන් සඳහා ප්‍රමුඛතාවය ලබා දෙනු ලැබේ.

08. පුරප්පාඩු සංඛ්‍යාවට වඩා උපාධිධාරින් අයදුම් කර තිබේ නම් අනුස්ථාපන හා සමායෝජන පාඨමාලාවට බඳවා ගැනීම සඳහා සාමාන්‍ය දැනීම හා අභියෝග්‍යතාව පිළිබඳ පැය 01 ක ප්‍රශ්න පත්‍රයකින් යුත් ලිඛිත විභාගයක් පවත්වා එම විභාගයේ දී දක්වන කුසලතාවය අනුව 164 දෙනෙකු පුහුණුවට බඳවා ගැනීම සිදු කෙරේ.

09. සම්මුඛ පරීක්ෂණයේ දී අයදුම්කරුවන් / අයදුම්කාරියන් විසින් පහත සඳහන් ලියවිලිවල මුල් පිටපත් හා එහි සහතික කරන ලද පිටපත බැගින් ඉදිරිපත් කළ යුතු ය.

I. උප්පැන්න සහතිකය,

II. උපාධි සහතිකයේ මුල් පිටපත (මෙහි සහතික කළ පිටපතක් අයදුම්පත සමඟ ද අමුණා එවිය යුතු ය.

III. විස්තරාත්මක උපාධි සහතිකයේ (Transcript) මුල්පිටපත,

IV. අ.පො.ස (උ.පෙළ) විභාග ප්‍රතිඵල දැක්වෙන සහතිකයේ මුල් පිටපත,

V. ජාතික හැඳුනුම්පත හෝ වලංගු විදේශ ගමන් බලපත්‍රය හෝ වලංගු රියදුරු බලපත්‍රය,

VI. වෛද්‍ය සභාවේ ලියාපදිංචිය (SLMC) සනාථ කිරීමේ සහතිකය.

10. පුහුණු කිරීමේ පරිපාටිය :-

I. සම්මුඛ පරීක්ෂණයට ලක් කරන ලද අයදුම්කරුවන් අතරින් තෝරාගත් අයදුම්කරුවන් / අයදුම්කාරියන් අනුස්ථාපන හා සමායෝජන පාඨමාලාව ඉංග්‍රීසි මාධ්‍යයෙන් හැදෑරීමට මාස 06ක කාලයක් සඳහා රෝහල් හා වෙනත් ආයතන වෙත අනුයුක්ත කරනු ලැබේ.

II. අභ්‍යාසලාභීන් සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය මඟින් කලින් කලට පනවනු ලබන වෙනත් නියෝගවලට ද යටත් වනු ඇත.

III. පුහුණුව ලබන කාලපරිච්ඡේදය අවසානයේ දී පුහුණුව සාර්ථකව නිම නොකරන, වැඩ හා හැසිරීම සතුටුදායක නොවන හෝ තමන් අනුයුක්ත කරනු ලබන ආයතනයේ පවතින කොන්දේසි පිළිපැදීමට අපොහොසත්වන අභ්‍යාසලාභීන්ගේ පුහුණුව, ඕනෑම අවස්ථාවක දී වන්දි ගෙවීමකින් තොරව අවසන් කළ හැකි ය.

IV. පුහුණුව ලබන කාල පරිච්ඡේදය තුළ දී අභ්‍යාසලාභීන්ට රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 10/2025 වන විධිවිධාන අනුව දීමනා ගෙවනු ලැබේ.

V. පුහුණුවට ඇතුලත් කරනු ලබන අවස්ථාවේ දී පුහුණුව සාර්ථකව නිම කරන බවටත්, පුහුණු පාඨමාලාව අත්හැර නොයන බවටත්, එකී පුහුණුව සම්පූර්ණයෙන්ම නිම කිරීමෙන් පසු අදාළ තනතුරේ පත්වීම් ලදහොත් අවම වශයෙන් වර්ෂ පහක (05) කාලපරිච්ඡේදයක් අදාළ තනතුරේ සේවය කරන බවටත්, සෞඛ්‍ය ලේකම්වරයා සමඟ ගිවිසුමකට හා ඇපකරයකට එළඹිය යුතු ය. පුහුණු කාලසීමාව තුළදී පුහුණුව හැරගියහොත්, පුහුණුවෙන් පසු පත්වීම භාර නොගතහොත්, ඉහත III වගන්තියේ සඳහන් ආකාරයට පුහුණුවෙන් ඉවත් කිරීමට සිදුවුවහොත් හෝ පත්වීම් ලැබ වර්ෂ (05) පහක කාල පරිච්ඡේදයක් අදාළ තනතුරේ සේවය කිරීමට අපොහොසත් වුවහොත් යන ඕනෑම හේතුවක දී පුහුණු කාලය තුළ දී ඔහුට / ඇයට ගෙවන ලද දීමනාව, රජය විසින් දරන වියහියදම්, ගිවිසුමට හා ඇපකරයට අදාළ මුදල ඔහු / ඇය විසින් සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය වෙත ගෙවිය යුතු ය. එසේ නොමැති වුවහොත් එම මුදල් අයකර ගැනීමට ගිවිසුම් ප්‍රකාරව නීත්‍යානුකූලව කටයුතු කිරීමට පියවර ගනු ඇත.

11. සේවයේ නියුක්ත කරවීමේ නියමයන් :

පුහුණුව අවසානයේ අදාළ තනතුරේ ස්ථිර පත්වීම් ප්‍රදානය කිරීම සිදුකරන / නොකරන බව තීරණය කරනු ලබන්නේ එම අවස්ථාවේ පවතින පුරප්පාඩු ප්‍රමාණය මත පදනම්වය. ඒ අනුව අදාළ තනතුරේ ස්ථිර පත්වීම් ප්‍රදානය කිරීමට සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය තීරණය කලහොත් අපේක්ෂක/ අපේක්ෂිකාවන් තමන් පුහුණුවට බඳවාගත් පාඨමාලාවට අදාළ බඳවා ගැනීමේ පටිපාටියේ කොන්දේසි හා පුරප්පාඩු මත අදාළ තනතුරේ III වන ශ්‍රේණියේ තනතුරට පත් කිරීමට කටයුතු කෙරේ. පරිපූරක වෘත්තීන්ගේ සේවාවේ තනතුරු සඳහා රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 10/2025 අනුව MT-6-2025 හි පරිදි

රු. 54,120 -10x800-11x1,190-10x1,320-10x1,350 -රු. 101,910/-

යන වැටුප් පරිමාණය හිමිවන අතර ගෙවීම් රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 10/2025 හි විධිවිධාන අනුව සිදු කරනු ලැබේ.

12. අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් පිළිබඳ විස්තර අයදුම්පත පිරවීමේ දී ඉතා සැලකිලිමත්ව හා නිවැරදිව ඇතුලත් කළ යුතු ය. පුහුණුව සඳහා බඳවා ගැනීමෙන් හෝ පත්වීම ලැබීමෙන් පසු ඉහත සහතික ව්‍යාජ බවට ඔප්පු වුවහොත්, නීත්‍යානුකූලව කටයුතු කිරීම සඳහා අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව වෙත යොමු කිරීමටත්, දෙනු ලබන පත්වීම අවලංගු කර පුහුණුවෙන්/තනතුරින් පහකර ඒ සම්බන්ධයෙන් විනයානුකූලව කටයුතු කර නැවත රජයේ සේවයට නොගන්නවුන්ගේ අසාධු ලේඛනයට ඔහුගේ/ ඇයගේ නම ඇතුලත් කිරීමටත් කටයුතු කරනු ලැබේ. තවද පුහුණු කාලය තුළ දී ඔහුට/ඇයට ගෙවන දීමනාව, රජය විසින් දරන වියහියදම්හි ගිවිසුමට හා ඇපකරයට අදාළ මුදල ඔහුගෙන්/ඇයගෙන් අය කර ගැනීමට කටයුතු කරනු ලැබේ.

13. තෝරාගත් අයදුම්කරුවන් අදාළ පාඨමාලාව හැදෑරීමට හා දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට කායික හා මානසික යෝග්‍යතාවයකින් හෙබි බව සනාථ කරනු පිණිස පුහුණුවීමේ පළමු මාසය ඇතුලත වෛද්‍ය පරීක්ෂණයකට පෙනී සිටිය යුතු අතර, වෛද්‍ය පරීක්ෂණයේ දී අයෝග්‍ය බව පෙනී යන අයදුම්කරුවන් පාඨමාලාවේ රැඳී සිටීමට නුසුදුස්සන් වනු ඇත.

14. ඉහත පරිදි බඳවා ගන්නා ලද සියලුම දෙනා රජයේ නිලධාරින්ට අදාළවන සියලුම නීතිරීති, ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ විධිවිධානයන්ට, සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය විසින් නියම කරනු ලබන ප්‍රතිපත්තිවලට, මුදල් රෙගුලාසි හා වෙනත් රෙගුලාසිවලට ද රජය විසින් වරින් වර පනවනු ලබන නීතිරීති හා නියෝගයන්ට ද යටත් වනු ඇත.

15. පුහුණුවට බඳවා ගනු ලබන අයදුම්කරුවන් සඳහා නේවාසික පහසුකම් සැපයීමට මෙම අමාත්‍යාංශය බැඳී නොසිටියි. ලබාදෙන්නේ නම්, ඒ සඳහා තක්සේරු නිවාස, කාමර කුලිය, ජල හා විදුලි බිල්පත් අයකරනු ලැබේ.

16. පුහුණුවට බඳවා ගැනීම සම්බන්ධයෙන් මෙම *ගැසට්* නිවේදනය මඟින් ආවරණයවන හෝ නොවන යම් කරුණක් සම්බන්ධයෙන් යම් ගැටලු සහගත තත්වයක් උදා වුවහොත් ඒ පිළිබඳව සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ තීරණය අවසන් තීරණය වනු ඇත.

මෙම *ගැසට්* නිවේදනයේ සිංහල, දෙමළ, ඉංග්‍රීසි භාෂා පාඨ අතර යම් පරස්පරතාවයක් ඇති වුවහොත් එවිට සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුතු වන්නේ ය.

විශේෂඥ වෛද්‍ය **අනිල් ජාසිංහ,**
ලේකම්,
සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය.

2026 ජුනි මස 03 දින,
සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය,
අංක 385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත, කොළඹ 10.

**ආදර්ශ අයදුම්පත**

***වෛද්‍ය කර්මය සඳහා වූ පරිපූරක වෘත්තීන්ගේ සේවාවේ ඖෂධවේදී තනතුර සඳහා අනුස්ථාපන හා සමායෝජන පාඨමාලාව සඳහා උපාධිධාරීන් බඳවා ගැනීම - 2026***

(අයදුම්පත සම්පූර්ණ කිරීමට පෙර *ගැසට්* නිවේදනය හොඳින් කියවා බලන්න)

1. (අ) මුලකුරු සමග අගට යෙදෙන නම : ........................................................................................
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) උදා. A.B.C.SILVA

(ආ) සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) : ..............................................................................

(ඇ) සම්පූර්ණ නම (සිංහලෙන්/දෙමළෙන්) : .....................................................................................

2. ජාතික හැඳුනුම්පත් අංකය : .............................................................................. (පිටපතක් අමුණන්න)

3. තැපැල් ලිපිනය :

| | සිංහලෙන්/දෙමළෙන් | ඉංග්‍රීසියෙන් |
|---|---|---|
| | ....................................... | ....................................... |
| | ....................................... | ....................................... |
| | ....................................... | ....................................... |
| | ....................................... | ....................................... |

4. (අ) ස්ථිර ලිපිනය :

| | සිංහලෙන්/දෙමළෙන් | ඉංග්‍රීසියෙන් |
|---|---|---|
| | ....................................... | ....................................... |
| | ....................................... | ....................................... |
| | ....................................... | ....................................... |
| | ....................................... | ....................................... |

(ආ) දුරකථන අංකය : ජංගම [ ]

ස්ථිර [ ]

(ඇ) පදිංචි දිස්ත්‍රික්කය : සිංහලෙන්/දෙමළෙන් ........................ ඉංග්‍රීසියෙන් ..................................

(ඈ) ඔබ මෙම දිස්ත්‍රික්කය තුළ ස්ථිර පදිංචිකරුවෙක්ද? ඔව්/නැත : ..................................................

(ඉ) ඔව් නම් කොපමණ කලක පටන්ද? : ..........................................................................................

5. උපන් දිනය : වර්ෂය ............................ මාසය ............................ දිනය .........................................
2026.07.01 දිනට වයස : අවුරුදු ......................... මාස .......................... දින .................................

6. ස්ත්‍රී/පුරුෂ භාවය : ස්ත්‍රී ☐ පුරුෂ ☐ (අදාළ කොටුවේ √ ලකුණ යොදන්න.)

7. ඔබ ශ්‍රී ලංකාවේ පුරවැසියෙක් ද යන වග :- ඔව් ☐ නැත ☐ (අදාළ කොටුවේ √ ලකුණ යොදන්න.)

8. විවාහක/අවිවාහක බව : විවාහක ☐ අවිවාහක ☐ (අදාළ කොටුවේ √ ලකුණ යොදන්න.)

9. අධ්‍යාපන සුදුසුකම් :

| *අනු අංකය* | *සමත් වූ උපාධිය* | *සාමාර්ථය* | *ශ්‍රේණියේ සාමාන්‍ය අගය (GPA)හා උපාධිය බල පවත්වන දිනය* | *විශ්වවිද්‍යාලය* | *අධ්‍යයන වර්ෂය* |
|---|---|---|---|---|---|
| | | | | | |

10. ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ (SLMC) ලියාපදිංචි අංකය හා දිනය :- .....................................................

11. ලිඛිත විභාගයක් පැවැත්වුවහොත් පෙනී සිටීමට අපේක්ෂා කරන භාෂා මාධ්‍ය :- ................................

12. ඔබ කවරදාක හෝ කවර හෝ චෝදනාවක් සඳහා උසාවියකින් වරදකරු වී තිබේද? ඔව් ☐ නැත ☐
(අදාළ කොටුවේ√ ලකුණ යොදන්න.)

"ඔව්" නම් විස්තර සපයන්න :- ..........................................................................................................

13. **අයදුම්කරුගේ සහතිකය :**

(අ) මා විසින් *ගැසට්* නිවේදනය හොඳින් කියවා බලා අවබෝධ කරගෙන එහි සඳහන් සියලු කොන්දේසිවලට යටත්ව මෙම අයදුම්පත සම්පූර්ණ කළ බවත්, මෙම අයදුම්පතෙහි මා විසින් සපයා ඇති තොරතුරු මා දන්නා තරමින් සත්‍ය හා නිවැරදි බවත් ගෞරවයෙන් ප්‍රකාශ කර සිටිමි.

(ආ) මා විසින් කරන ලද මෙම ප්‍රකාශය හෝ අයදුම්පතෙහි සඳහන් කර ඇති කුමන හෝ තොරතුරක් අසත්‍ය යැයි ඔප්පු වුවහොත් මා සේවයෙන් පහ කරනු ලැබීමට යටත් බව ද මම දැන සිටිමි.

| ලංකා බැංකු තැප්‍රොබේන් ශාඛාවේ, අංක 7041318 දරන සෞඛ්‍ය ලේකම්වරයාගේ විභාග ගාස්තු රැස්කිරීම යන ගිණුමට අදාළ මුදල් ගෙවා එම ලදුපතෙහි මුල් පිටපත මෙම ස්ථානයේ නොගැලවෙන සේ අලවන්න. |
|---|

……................................ ................................................,
දිනය අයදුම්කරුගේ/අයදුම්කාරියගේ අත්සන.

14. **අයදුම්කරුගේ අත්සන සහතික කිරීම :**

මෙම අයදුම්පත ඉදිරිපත් කරනු ලබන ............................... මයා/මිය/මෙනෙවිය මා පෞද්ගලිකව දන්නා හඳුනන බවද, ඔහු/ඇය ............................... දින මා ඉදිරිපිට දී ඔහුගේ/ඇයගේ අත්සන තැබූ බව ද සහතික කරමි.

......................................... ................................................,
දිනය සහතික කරන්නාගේ අත්සන,
සහතික කරන්නාගේ නිල මුද්‍රාව.

සහතික කරන නිලධරයාගේ සම්පූර්ණ නම : ..........................................................................................
තනතුර : ..........................................................................................................................................
ලිපිනය : ..........................................................................................................................................

15. **ඉල්ලුම් කරන අපේක්ෂකයා රාජ්‍ය සේවාවේ/පළාත් රාජ්‍ය සේවයේ නියුතු අයෙක් නම්, දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය : (අදාළ නොවන වචන කපා හරින්න.)**

(i.) ඉහත අයදුම්කරු/අයදුම්කාරිය වන .......................................... මහතා/මහත්මිය/මෙනවිය මෙම දෙපාර්තමේන්තුවේ ................................................. තනතුර දරන බව මින් සහතික කරමි.

(ii.) ඉල්ලුම් පත්‍රයේ සඳහන් තොරතුරු සත්‍ය තොරතුරු බව සහතික කරන අතර, ඔහු/ඇය තනතුර සඳහා තෝරා ගත හොත් ඔහු/ඇය දරන තනතුරට නිදහස් කල හැකි/නොහැකි බව දන්වමි.

(iii.) එමෙන්ම මෙම බඳවා ගැනීම බාහිර බඳවා ගැනීමක් බවත්, ඔහු/ඇය අදාළ පුහුණුව සාර්ථකව සම්පූර්ණ කිරීමෙන් හෝ නොකිරීමෙන් පසු කිසිදු අයුරකින් දැනට දරන තනතුරට නැවත පැමිණිය නොහැකි බවත්, ඔහුට/ඇයට අවබෝධ කරදුන් බවත් දන්වා සිටිමි.

................................................. ..............................................,
දිනය දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන.

දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ නම : ..........................................................................................
තනතුර :..........................................................................................................................................
ලිපිනය : ..........................................................................................................................................

දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ නිල මුද්‍රාව.

06 - 150

---

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

**වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමුපකාර සංවර්ධන අමාත්‍යාංශය**

සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ සමාගම් පරීක්ෂක නිලධාරී තනතුර සඳහා බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2026

සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ සමාගම් පරීක්ෂක නිලධාරී තනතුර සඳහා බඳවා ගැනීමේ විවෘත තරග විභාගය සඳහා සුදුසුකම්ලත් ශ්‍රී ලංකා පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ www.doenets.lk වෙබ් අඩවියේ "Our Services" යටතේ ඇති "Online Applications-Recruitment Exams/E.B.Exams" ඔස්සේ පළකර ඇති අතර අයදුම්පත් ඉදිරිපත් කළ හැක්කේ මාර්ගගත ක්‍රමයට (Online) පමණි. මාර්ගගත අයදුම්පත් භාර ගැනීම 2026.06.15 දින පෙ.ව. 9.00 ට විවෘත වන අතර" 2026.07.13 දින රාත්‍රී 9.00ට අවසන් වේ. **අයදුම්පත් යොමු කිරීම අවසාන දිනය දක්වා ප්‍රමාද කිරීමෙන් ඇති වන ඕනෑම අහිතකර තත්ත්වයක් අයදුම්කරු විසින් විඳ දරා ගත යුතු ය.**

දැනට රාජ්‍ය /පළාත් රාජ්‍ය සේවයේ නියුතු නිලධාරීන් අයදුම්පතේ පිටපතක් තම පෞද්ගලික ලිපි ගොනුවට ඇතුළත් කිරීම සඳහා ආයතන ප්‍රධානීන් වෙත භාරදිය යුතු අතර, සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලබන අවස්ථාවේ දී ආයතන ප්‍රධානියා විසින් සහතික කළ අයදුම්පතේ පිටපතක් සහ සේවය සනාථ කිරීමේ ලිපියක් ඉදිරිපත් කළ යුතු ය.

1. මෙම නිවේදනයේ "දෙපාර්තමේන්තු ප්‍රධානියා" යනුවෙන් අදහස් කරනුයේ සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා වේ. මෙම විභාගය මගින් බඳවා ගැනීම සිදු කරනුයේ සමාගම්

රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ සමාගම් පරීක්ෂක නිලධාරී තනතුරෙහි III ශ්‍රේණිය සඳහා වේ. වෙනත් ආකාරයකින් සුවිශේෂී කොට නොමැති අවස්ථාවන්හි දී "තනතුර" යන පදයෙන් අදහස් කරනුයේ සමාගම් පරීක්ෂක නිලධාරී තනතුරෙහි III ශ්‍රේණිය වේ.

2. අයදුම්පත් භාර ගන්නා අවසන් දිනය **2026.07.13** දින වේ.

2.1. *ලිඛිත විභාගය.-* මෙම විභාගය පහත සඳහන් ප්‍රශ්න පත්‍ර දෙකකින් (02) සමන්විත වේ.

I. භාෂා හැකියාව
II. අභියෝගතාව

2.2. *විභාග දිනය.-* මෙම විභාගය 2026 සැප්තැම්බර් මස කොළඹ දී පැවැත්වෙනවා ඇත. මෙම විභාගය කල් දැමීමට හෝ අවලංගු කිරීමට හෝ සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල්වරයාට බලය ඇත.

2.3. *සම්මුඛ පරීක්ෂණය.-* ලකුණු ලබාදීමක් සිදු නොවන අතර සුදුසුකම් පරීක්ෂා කිරීම පමණක් සිදු කරනු ලැබේ.

3. පත් කරනු ලබන සංඛ්‍යාව හය (06) කි. අවසාන පුරප්පාඩුව සඳහා හෝ අවසාන පුරප්පාඩු කිහිපය සඳහා සම ලකුණු ලබා ගත් අපේක්ෂකයන් පුරප්පාඩු සංඛ්‍යාව ඉක්මවා සිටින අවස්ථාවකදී එම පුරප්පාඩු සංඛ්‍යාව පිරවීම පිළිබඳව අවසාන තීරණය සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා විසින් ගනු ලබන අතර, මෙම බඳවා ගැනීම්වල පත්වීම ක්‍රියාත්මක වන දිනය ද සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා විසින් තීරණය කරනු ලබනු ඇත.

4. සේවා කොන්දේසි :

4.1. රාජ්‍ය සේවයේ පත්වීම් පාලනය කෙරෙන පොදු කොන්දේසිවලට ද, ආයතන සංග්‍රහය හා මුදල් රෙගුලාසි විධිවිධානවලට ද අංක 2310/29 සහ 2022.12.14 වැනි දින දරන අතිවිශෙෂ *ගැසට්* පත්‍රයේ පළ කරන ලද රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්යපටිපාටික රීතිවලට ද, 2018.07.31 දිනැතිව රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද සමාගම් රෙජිස්ටාර් දෙපාර්තමේන්තුවේ සමාගම් පරීක්ෂක නිලධාරී සේවයේ තනතුරු සඳහා වන බඳවා ගැනීම් පටිපාටියේ නියමයන්ට හා කොන්දේසිවලට ද එම පටිපාටියට කර ඇති හෝ මින් මතුවට කෙරෙන්නා වූ සංශෝධනවලට ද යටත්ව තෝරාගනු ලබන අපේක්ෂකයින් තනතුරෙහි III ශ්‍රේණිය සඳහා පත් කෙරෙනු ඇත.

4.2. මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිත ය. එහෙත් නව පත්වීම්ලාභීන්ට පිරිනමනු ලබනු ලබන විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේ දී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයන්ට පත්වීම්ලාභීන් යටත් විය යුතු ය.

4.3. අවුරුදු තුනක (03) පරිවාස කාලයකට යටත්ව සමාගම් පරීක්ෂක නිලධාරී තනතුරේ III ශ්‍රේණියට බඳවා ගනු ලබයි. බඳවා ගනු ලැබුවකු වසර තුනක් ඇතුළත බඳවා ගැනීම් පටිපාටියෙහි සඳහන් කර ඇති පරිදි පළමුවැනි කාර්යක්ෂමතා කඩඉම් පරීක්‍ෂණයෙන් සමත් විය යුතු ය.

4.4. රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 1/2014 අනුව හා ඊට අනුශාංගික චක්‍රලේඛ අනුව තනතුරට බැඳී වසර පහක් (05) ඇතුළත නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතාව ලබාගත යුතු ය.

5. මාසික වැටුප් පරිමාණය :

2025.03.25 දිනැති අංක 10/2025 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ උපලේඛන I අනුව මෙම තනතුරට අදාළ මාසික වැටුප් පරිමාණය රු. 53,060-10 x 800-11 x 1,190-10 x 1,320-5 x 1,350- රු. 94,100/- (MN-4/2025) වේ.

එමෙන්ම වැටුප් ගෙවනු ලබන්නේ එම චක්‍රලේඛයේ විධිවිධානවලට අනුකූලව එහි උපලේඛන II හි සඳහන් පරිදි වේ. මෙයට අමතරව රජයේ නිලධරයන් වෙත රජය විසින් කලින් කලට ගනු ලබන වෙනත් දීමනා ද හිමි වේ.

6. බඳවා ගැනීමේ සුදුසුකම් :

6.1. I. ශ්‍රී ලංකාවේ පුරවැසියකු වීම.
II. විශිෂ්ට චරිතයකින් යුක්ත වීම.

6.2. අධ්‍යාපන සුදුසුකම් :

I. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් උපාධියක් ලබා තිබීම.

6.3. කායික සුදුසුකම් :

සෑම අපේක්ෂකයකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්, තනතුරේ රාජකාරී ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවකින් යුක්ත විය යුතු ය.

6.4. වයස :

අයදුම්පත් භාරගන්නා අවසන් දිනට අවුරුදු 21ට නොඅඩු විය යුතු අතර අවුරුදු 35ට නොවැඩි විය යුතු ය.

ඒ අනුව 2005.07.13 වැනි දිනට හෝ ඊට පෙර හා 1991.07.13 දිනට හෝ ඊට පසු උපන් දිනය යෙදී ඇති අයට පමණක් මේ සඳහා අයදුම් කිරීමට සුදුසුකම් ඇත.

7. විභාග ගාස්තු:

විභාග ගාස්තුව රු. 600.00 කි. විභාග ගාස්තු ගෙවීමේ දී මාර්ගගත පද්ධතියෙන් ලබා දෙන පහත ගාස්තු ගෙවීමේ ක්‍රමවේද යටතේ පමණක් ගෙවීම් සිදු කළ යුතු ය.

I. ඕනෑම බැංකු ණය කාඩ්පතක් මගින් (Any Bank Credit Card),
II. අන්තර්ජාල ගෙවීම් පහසුකම් සහිත ඕනෑම බැංකු හර කාඩ්පතක් මගින්(Any Bank Debit card with the Facility of Internet Transactions),
III. ලංකා බැංකු මාර්ගගත බැංකු ක්‍රමය /Flex යෙදවුම මගින් (Online Banking Method / Flex App of Bank of Ceylon),
IV. ඕනෑම ලංකා බැංකු ශාඛාවක් මගින් (Any Branch of the Bank of Ceylon).

*සටහන* :-

(*අ*) ඉහත ක්‍රම මගින් ගෙවීම් සිදු කරන ආකාරය පිළිබඳ උපදෙස් වෙබ් අඩවියේ විභාගයට අදාළ තාක්ෂණික උපදෙස් යටතේ පළකර ඇත.

(*ආ*) ගෙවීම් ලැබුණු බවට කෙටි පණිවුඩයක් මගින් හෝ විද්‍යුත් තැපැල් පණිවුඩයක් මගින් හෝ දන්වනු ලැබේ. විභාග ගාස්තුව සඳහා වන සම්පූර්ණ මුදලම ගෙවිය යුතු වන අතර විභාග ගාස්තු අඩුවෙන් හෝ වැඩියෙන් ගෙවා ඇති අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. ඉහත සඳහන් ගෙවීම් ක්‍රම මගින් විභාග ගාස්තු ගෙවීමේ දී සිදුවන දෝශ සම්බන්ධයෙන් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වග කියනු නොලැබේ.

(*ඇ*) විභාගය සඳහා ගෙවන ලද මුදල කිසිම හේතුවක් නිසා ආපසු ගෙවීමක් හෝ වෙනත් විභාගයක් සඳහා මාරු කිරීමක් හෝ සිදු කරනු නොලැබේ.

8. අයදුම් කිරීමේ ක්‍රමය :

8.1. මාර්ගගත (online) විභාග අයදුම්පත ඉංග්‍රීසි භාෂාවෙන් පමණක් සම්පූර්ණ කළ යුතු ය. අයදුම්කරු විසින් මාර්ගගතව යොමු කරන ලද මෘදු පිටපත වලංගු අයදුම්පතක් බවට දෙපාර්තමේන්තුව විසින් භාරගන්නා ලද බව/භාර නොගන්නා බව පද්ධතියට ප්‍රවේශ වීමට භාවිත කරන ලද ජංගම දුරකථන අංකයට කෙටි පණිවුඩයක් (SMS) මඟින් හෝ විද්‍යුත් තැපැල් (e-mail) ලිපිනයට හෝ දැනුම් දෙනු ලැබේ. මාර්ගගත අයදුම්පත සම්පූර්ණ කිරීමට පෙර විභාගය සඳහා අයදුම් කිරීම වෙනුවෙන් සකසා ඇති උපදෙස් පත්‍රිකාව (Instructions) බාගත කර ගන්න. අයදුම්පත පිරවීමේදී එම උපදෙස් තරයේ පිළිපදින්න. අයදුම්පතේ මුද්‍රිත පිටපතක් ලබා ගැනීමෙන් පසුව එහි සිදු කරනු ලබන කිසිඳු සංශෝධනයක් වලංගු සංශෝධනයක් ලෙස සලකනු නොලැබේ. අසම්පූර්ණ අයදුම්පත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

8.2. *ගැසට්* නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති අය පමණක් ඉල්ලුම් කර ඇතැයි යන පූර්ව නිගමනය මත අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට හෝ එදිනට පෙර නියමිත විභාග ගාස්තුව ගෙවා ඊට අදාළ ලදුපත සමග නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත් යොමු කර ඇති අයදුම්කරුවන් වෙත විභාග කොමසාරිස් ජනරාල්වරයා විසින් විභාග ප්‍රවේශ පත්‍ර මාර්ගගතව පමණක් නිකුත් කරනු ඇත. විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් ඒ බව වෙබ් නිවේදනයක් මගින් / අයදුම්කරුවන් වෙත කෙටි පණිවුඩයක් මගින් දන්වනු ලැබේ. තම ප්‍රවේශ පත්‍රය නොලද අපේක්ෂකයකු වේ නම් දැන්වීමේ සඳහන් පරිදි ඒ පිළිබඳව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ ආයතනික විභාග සංවිධාන ශාඛාවෙන් විමසිය යුතු ය. එසේ විමසීමේදී අයදුම්කරු තමා ඉල්ලුම්කරන ලද විභාගයේ නම, අයදුම්කරුගේ සම්පූර්ණ නම, ජාතික හැඳුනුම්පත් අංකය හා ලිපිනය නිවැරදිව සඳහන් කළ ඉල්ලීම් ලිපියක් වෙබ් නිවේදනයේ සඳහන් විද්‍යුත් තැපැල් ලිපිනය වෙත යොමු කර විමසා සිටීම වඩාත් ඵලදායී වනු ඇත. එසේ විමසීමේදී විභාග දෙපාර්තමේන්තුව විසින් විමසා සිටින කිසියම් තොරතුරක් සනාථ කිරීම සඳහා සම්පූර්ණ කරන ලද අයදුම්පතේ ඡායා පිටපත, විභාග ගාස්තු ගෙවීමෙන් ලද ලදුපතෙහි ඡායා පිටපත ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. ප්‍රවේශ පත්‍රය පරීක්ෂා කර බලා සංශෝධන වෙතොත් කල්වේලා ඇතිව විභාග දෙපාර්තමේන්තුව අමතා අයදුම්පතට අනුව අදාළ සංශෝධන සිදු කර ගත යුතු ය. විභාග ශාලාවේදී / සම්මුඛ පරීක්ෂණයේදී සංශෝධන සඳහා කරනු ලබන ඉල්ලීම් සලකා බලනු නොලැබේ.

9. විභාගයට ඇතුළුවීම :

9.1. විභාග කොමසාරිස් ජනරාල්වරයා විසින් විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කරනු ලැබ ඇති අයදුම්කරුවන්

සඳහා පමණක් විභාගයට පෙනී සිටීමට අවසර දෙනු ලැබේ. විභාග දින එම ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් නොකරන අපේක්ෂකයකු හට විභාගයට පෙනී සිටීමට අවසර දෙනු නොලැබේ.

9.2. අපේක්ෂකයන් විසින් තමාට නියම කර ඇති විභාග ශාලාවේදී විභාගයට පෙනී සිටිය යුතු අතර, සෑම අපේක්ෂකයකුම තම අත්සන සහතික කරන ලද ප්‍රවේශ පත්‍රය එම විභාග ශාලාවේ දී පළමුවෙන්ම පෙනී සිටින දින එහි ශාලාධිපතිවරයා වෙත භාර දිය යුතු ය. සෑම අපේක්ෂකයකුම අනුගමනය කළ යුතු නීති මාලාවක් මෙම *ගැසට්* පත්‍රය ආරම්භයේ පළකර ඇත.

*සටහන* - විභාග අපේක්ෂකයකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම, එම අපේක්ෂකයා විභාගයට ඉදිරිපත් වීම සඳහා හෝ තනතුරක් දැරීම සඳහා හෝ මෙම නිවේදනය මගින් ඉල්ලා ඇති සියලුම සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස සලකනු නොලැබේ.

10. අපේක්ෂකයාගේ අනන්‍යතාව :

විභාග අපේක්ෂක/ අපේක්ෂිකාවන් විභාග ශාලාව තුළ දී තමන් පෙනී සිටින සෑම විෂයයක් සඳහාම ශාලාධිපති සෑහීමකට පත්වන පරිදි ස්වකීය අනන්‍යතාව සනාථ කළ යුතු ය. ඒ සඳහා පහත දැක්වෙන ලේඛන පමණක් වලංගු වේ.

I. ජාතික හැඳුනුම්පත,
II. වලංගු විදේශ ගමන් බලපත්‍රය,
III. වලංගු ශ්‍රී ලාංකික රියදුරු බලපත්‍රය.

එමෙන් ම විභාග අපේක්ෂකයන් අනන්‍යතාව තහවුරු කර ගත හැකි වන පරිදි මුහුණ ආවරණය කිරීමෙන් තොරව හා විද්‍යුත් සන්නිවේදන උපාංග පැළඳගෙන නොමැති බව සනාථ කර ගත හැකි වන පරිදි දෙකන් ආවරණය කිරීමෙන් තොරව විභාග ශාලාවට ඇතුළු විය යුතු ය. ඊට එකඟ නොවන අයදුම්කරුවන් විභාග ශාලාවට ඇතුළත් කර නොගැනේ. තව ද විභාග ශාලාවට ඇතුළු වූ මොහොතේ සිට විභාගය අවසන් වී ඉන් පිටවන තෙක් මුහුණ හා දෙකන් ආවරණය කිරීමෙන් තොරව සිටිය යුතු ය.

11. සාවද්‍ය තොරතුරු සැපයීමට දඬුවම් :

අයදුම්පත පිරවීමේ දී ඉතා සැලකිලිමත්ව නිරවද්‍ය තොරතුරු සැපයිය යුතු ය. මෙම විභාගයේ නීති රීති අනුව යම් අපේක්ෂකයකු හට සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත් විභාගයට කලින් හෝ විභාගය පවත්වන කාලයේ දී හෝ විභාගයෙන් පසුව හෝ යන ඕනෑම අවස්ථාවක දී අපේක්ෂකයාගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ඇත.

12. අවශ්‍ය අවස්ථාවක දී, මෙම නිවේදනයේ සඳහන් කර නොමැති කරුණු පිළිබඳව සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා විසින් තීරණය කරන පරිදි කටයුතු කරනු ඇත.

13. විභාගය පැවැත්වීම :

13.1 විභාගය සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මධ්‍යයන්ගෙන් පවත්වනු ලැබේ.

13.2 අපේක්ෂකයෙකු විභාගයට පෙනී සිටිය යුතු වන්නේ සුදුසුකම්ලත් උපාධිය ලබා ගත් භාෂාවෙන් ම හෝ රාජ්‍ය භාෂාවකින් හෝ විය යුතු ය.

13.3 අපේක්ෂකයෙකු සුදුසුකම්ලත් උපාධියේ විෂයයන් භාෂා දෙකකින් හෝ වැඩි ගණනකින් හෝ සමත් වී ඇත්නම් එම උපාධියේ ඔහු සමත් වූ විෂයයන්ගෙන් වැඩි ගණනකට පෙනී සිටි භාෂාවෙන් හෝ රාජ්‍ය භාෂාවෙන් හෝ විභාගයට පෙනී සිටිය යුතු ය.

13.4 ප්‍රධාන විෂයය එක් භාෂාවකිනුත් අතිරේක විෂයය තවත් භාෂාවකිනුත් සමත් වී ඇති විශේෂ උපාධියක් ඇති අපේක්ෂකයකු ප්‍රධාන විෂයයෙන් සාමර්ථ්‍යය ලත් භාෂාවෙන් හෝ රාජ්‍ය භාෂාවකින් හෝ විභාගයට පෙනී සිටිය යුතු ය.

*සටහන :*

I. ඉහත 13.2 සහ 13.3 හි ඇති සුදුසුකම්ලත් උපාධිය යන පදයෙන් අදහස් කෙරෙන්නේ 6.2 හි (i) ඡේදයේ ඇති උපාධි සුදුසුකම වේ.
II. අපේක්ෂකයකු විභාගයේ දී පෙනී සිටින ප්‍රශ්න පත්‍ර දෙකටම එකම භාෂාවකින් පිළිතුරු සැපයිය යුතු ය.
III. තම ඉල්ලුම් පත්‍රයේ සඳහන් විභාග භාෂා මාධ්‍යය පසුව වෙනස් කිරීමට අපේක්ෂකයකුට ඉඩ දෙනු නොලැබේ.

14. බඳවා ගැනීමේ ක්‍රමය:

14.1 ලිඛිත විභාගය -

පහත සඳහන් විෂයන්ගෙන් සමන්විත ප්‍රශ්න පත්‍ර දෙකකින් (02) යුත් ලිඛිත විභාගයක් පවත්වනු ලබයි. අපේක්ෂකයන් විසින් විභාගයේ සියලුම විෂයයන් සඳහා පෙනී සිටිය යුතු ය. එම විෂයයන් සහ එක් එක් විෂයය සමත් වීමට ලබා ගත යුතු අවම ලකුණු ප්‍රමාණය පහත සඳහන් පරිදි වේ.

| විෂය අංකය | විෂයය | ලකුණු ප්‍රමාණය | සමත් වීමට ලැබිය යුතු අවම ලකුණු ප්‍රමාණය | කාලය (පැය) |
|---|---|---|---|---|
| 01. | භාෂා හැකියාව | 100 | 40% | 02 |
| 02. | අභියෝගතාව | 100 | 40% | 01 |

14.2 සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය :

I. ඉහත අංක 6 යටතේ දක්වා ඇති බඳවා ගැනීම් සුදුසුකම් සපුරා තිබේ ද යන්න පරීක්ෂා කිරීම සඳහා සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය පවත්වනු ලබයි. දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය පත් කරනු ලබයි.

II. එක් එක් විෂයය සඳහා අවම ලකුණු හතළිහක් (40%) හෝ ඊට ඉහළ ලකුණු ලබාගත් අපේක්ෂකයන් අතරින් සියලු විෂයයන්ට ලැබූ ලකුණුවල මුළු එකතුව අනුව ඉහළම ලකුණු ලබා ගන්නා අයදුම්කරුවන් සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයට පෙනී සිටීම සඳහා සුදුසුකම් ලබයි. එසේ සුදුසුකම් ලැබූ අයදුම්කරුවන් අතරින්, ලිඛිත විභාගයෙන් ඔවුන් විසින් ලබාගත් කුසලතා අනුපිළිවෙළ හා බඳවා ගැනීමට නියමිත සංඛ්‍යාවට සමාන සංඛ්‍යාවක් සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලබයි. බඳවා ගැනීමට නියමිත සංඛ්‍යාවට සමාන සුදුසුකම් ලැබූ අපේක්ෂකයන් සංඛ්‍යාවක් නොමැති වුවහොත් එවැනි අවස්ථාවන්හිදී සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලබන්නේ සුදුසුකම් ලැබූ අපේක්ෂකයන් සංඛ්‍යාව පමණි.

***සැලකිය යුතු යි -*** සම්මුඛ පරීක්ෂණයට සහභාගීවීම, පත්වීම පිරිනැමීමට සුදුසුකම් සම්පූර්ණ කිරීමක් සේ සලකනු නොලැබේ.

14.3 පුරප්පාඩු සංඛ්‍යාව අනුව, සියලුම සුදුසුකම් සම්පූර්ණ කර ඇති අයදුම්කරුවන් ලිඛිත විභාගයේදී ලබාගත් ලකුණු සංඛ්‍යාව මත ඉහළම ලකුණු ලබාගත් අයදුම්කරුගේ සිට කුසලතා අනුපිළිවෙළින් මෙම තනතුරට බඳවා ගනු ලැබේ.

14.4 ප්‍රතිඵල :

මෙම *ගැසට්* නිවේදනයේ 14.1 ඡේදය මගින් දක්වා ඇති පරිදි, අපේක්ෂකයන් විභාගයේ දී ලබා ගන්නා මුළු ලකුණු කුසලතාව අනුව සකස් කළ ප්‍රතිඵල ලේඛනය සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල් වෙත ලබාදෙනු ඇත. පත්වීම් බලධාරියාගේ එකඟතාව ලද පසු විභාගයට පෙනී සිටි සියලුම අයදුම්කරුවන් වෙත ප්‍රතිඵල පෞද්ගලිකව දන්වා යැවීම හෝ www.results.exams.gov.lk වෙබ් අඩවියේ ප්‍රසිද්ධ කිරීම හෝ සිදුකරනු ඇත. විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල්වරයා විසින් පනවනු ලබන නීති රීතිවලට විභාග අපේක්ෂකයන් යටත් වේ. එම නීති රීති උල්ලංඝනය කළහොත් විභාග කොමසාරිස් ජනරාල්වරයා විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔහුට හෝ ඇයට සිදුවනු ඇත. **විභාග ප්‍රතිඵල සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල්වරයාගේ තීරණය අවසන් තීරණය වේ.**

15. ලිඛිත විභාගයේ විෂය නිර්දේශය :

01. භාෂා හැකියාව - කාලය පැය 02යි. ලකුණු 100

මෙම ප්‍රශ්න පත්‍රය අපේක්ෂකයන්ගේ අදහස් ප්‍රකාශනය, අවබෝධය, අක්ෂර වින්‍යාසය, භාෂාව හා රචනය, දෙන ලද ලිපියක් කෙටුම්පත් කිරීම, සපයා ඇති දත්ත අනුව ප්‍රස්ථාර වගු සකස් කිරීම, දී ඇති පාඨ සාරාංශ කිරීම, දී ඇති වාක්‍ය කිහිපයක අදහස් තනි වාක්‍යයකින් ලිවීම සහ සරල ව්‍යාකරණ භාවිතය පිළිබඳ දැනුම පරීක්ෂා කෙරෙන විෂයානුබද්ධ ප්‍රශ්නවලින් සමන්විත වේ.

02. අභියෝගතාව - කාලය පැය 01යි. ලකුණු 100

මෙම ප්‍රශ්න පත්‍රය අපේක්ෂකයන්ගේ සංඛ්‍යාමය හැකියාවන්, තර්කන ශක්තිය, සාමාන්‍ය බුද්ධිය මැනෙන අයුරින් සැකසෙන විෂයානුබද්ධ ප්‍රශ්නවලින් සමන්විත වේ.

16. මෙහි සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යයෙන් පළවන මෙම නිවේදනයේ භාෂා පාඨ අතර කිසියම් අනනුකූලතාවක් හෝ නොගැළපීමක් වේ නම්, එවැනි අවස්ථාවක සිංහල මාධ්‍ය නිවේදනයට අනුව කටයුතු කළ යුතු ය.

සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල්,
සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව.

2026 ජුනි මස 02 දින,
අංක 400, ඩී.ආර්. විජේවර්ධන මාවත,
කොළඹ 10.

06 - 96

අධ්‍යාපන, උසස් අධ්‍යාපන හා වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය

ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය

**2026 දෙවන අර්ධ වර්ෂය (ජූලි කණ්ඩායම) ආධුනිකයන් බඳවා ගැනීම සඳහා අයදුම් කිරීම**

ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරියේ දිවයින පුරා පිහිටි ජාතික වෘත්තීය පුහුණු ආයතන, දිස්ත්‍රික් වෘත්තීය පුහුණු මධ්‍යස්ථානයන්හි හා දිස්ත්‍රික් මට්ටමින් ක්‍රියාත්මක අනෙක් වෘත්තීය පුහුණු මධ්‍යස්ථානයන්හි ක්‍රියාත්මක කරනු ලබන වෘත්තීය පුහුණු පාඨමාලා සඳහා 2026 දෙවන අර්ධ වර්ෂය (ජූලි කණ්ඩායම) ආධුනිකයින් බඳවා ගැනීම දැන් ආරම්භ කර ඇත. එම වෘත්තීය පුහුණු මධ්‍යස්ථානයන්හි ක්‍රියාත්මක NVQ (ජාතික වෘත්තීය සුදුසුකම්) පාඨමාලා හා NVQ නොවන පාඨමාලා, පාඨමාලා කේත අංක සහිතව පහත දක්වා තිබේ. NVQ මට්ටම හා පාඨමාලා කාලය ද සඳහන් කර ඇත.

පාඨමාලා විස්තර දැන ගැනීම සහ පාඨමාලා සඳහා අයදුම් කිරීම :

1. පාඨමාලා පිළිබඳ වැඩි විස්තර පහත දක්වන ලද ක්ෂණික දුරකථන අංකයන්ගෙන් / දිස්ත්‍රික් දුරකථන අංකයන් මගින් හා අපගේ WhatsApp දුරකතනය හා සම්බන්ධ වී SMS පණිවිඩ යොමු කිරීමෙන් ලබා ගත හැකිය.

2. ඔබ දිස්ත්‍රික්කයට ආසන්නතම වෘත්තීය පුහුණු අධිකාරියේ දිස්ත්‍රික් වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය / ජාතික වෘත්තීය පුහුණු ආයතනයට හෝ ග්‍රාමීය මධ්‍යස්ථානයට ගොස් අයදුම්පත් භාර දිය හැකිය.

3. පහතින් දක්වන ලද වෙබ් පිටුවට ගොස් මාර්ගගත (Online) ක්‍රමවේදය යටතේ ද පාඨමාලා සඳහා අයදුම් කළ හැකිය.

| | | |
|---|---|---|
| පාඨමාලා ආරම්භය | - | 2026 ජූලි 01 |
| වැඩි විස්තර සඳහා | - | |
| දුරකතන අංක (ක්ෂණික) | - | 011-7270270<br>011-7277888 |
| | - | 070-6767696 (WhatsApp) |
| ඊ-මේල් ලිපිනය | - | cgjp@vtasl.gov.lk |
| වෙබ් ලිපිනය | - | www.vtasl.gov.lk |
| ෆේස්බුක් පිටුව | - | VTA |

සභාපති,
ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය.

ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය,
4 වන මහල, නිපුණතා පියස,
ඇල්විටිගල මාවත,
නාරාහේන්පිට,
කොළඹ 05.

**දිස්ත්‍රික් මධ්‍යස්ථාන හා ජාතික වෘත්තීය පුහුණු ආයතන දුරකතන අංක :**

| දිස්ත්‍රික් මධ්‍යස්ථාන | | |
|---|---|---|
| 1 | අම්පාර (සිංහල) | 063 – 2223821 / 071 – 0318729 |
| 2 | අම්පාර (දෙමළ) | 067 – 2251155 / 071 – 0318729 |
| 3 | අනුරාධපුර | 025 – 2221400 / 071 – 4932730 |
| 4 | බදුල්ල | 057 – 2223043 / 071 – 0318731 |
| 5 | මඩකලපුව | 065 – 2050753 / 071 – 0318732 |
| 6 | කොළඹ | 011 – 2844151 / 071 – 5323232 |
| 7 | ගාල්ල | 091 – 2234540 / 071 – 1211729 |
| 8 | ගම්පහ | 033 – 2294790 / 071 – 1361130 |
| 9 | හම්බන්තොට | 047 – 2241724 / 071 – 0318721 |
| 10 | යාපනය | 021 – 2227949 / 071 – 0318737 |
| 11 | කළුතර | 034 – 2263698 / 071 – 0318736 |
| 12 | මහනුවර | 081- 2387200 / 071 – 9660269 |
| 13 | කෑගල්ල | 035 – 2282565 / 071 – 8011109 |
| 14 | කිලිනොච්චිය | 021 – 2285686 / 071 – 3956503 |
| 15 | කුරුණෑගල | 037 – 2237436 / 077 – 4545459 |
| 16 | මාතලේ | 066 – 2286683 / 071 – 0318749 |
| 17 | මාතර | 041 – 2235950 / 071 – 0318753 |
| 18 | මොනරාගල | 055 – 2274775 / 071 – 1213423 |
| 19 | මුලතිවු | 021 – 2290097 / 075– 9875980 |
| 20 | නුවරඑළිය | 052 – 2223216 / 071 – 1752322 |
| 21 | පොළොන්නරුව | 027 – 2245442 / 071 – 1212253 |
| 22 | පුත්තලම | 032 – 2254110 / 071 – 0318747 |
| 23 | රත්නපුර | 045 – 2274699 / 071 – 2842556 |
| 24 | ත්‍රිකුණාමලය | 026 – 2234517 / 071 – 1211536 |
| 25 | වවුනියාව | 024 – 2221617 / 075 – 5566733 |
| 26 | මන්නාරම | 024 – 2221617 / 075 – 5566733 |
| *ජාතික වෘත්තීය පුහුණු ආයතන* | | |
| 1 | නාරාහේන්පිට | 011 – 2592233 / 071 – 1315005 |
| 2 | රත්මලාන | 011 – 2638850 / 071 – 9476681 |
| 3 | බද්දේගම | 091 – 2293119 / 071 – 0318744 |
| 4 | නියාගම | 091 – 2296445 / 071 – 0796902 |
| 5 | මිරිජ්ජවිල | 047 – 2220501 / 071 – 1212372 |
| 6 | තලල්ල | 041 – 2259331 / 071 – 3202751 |
| 7 | මඩකලපුව | 065 – 2240159 / 071 – 0318729 |
| 8 | ඔරුගොඩවත්ත | 011 - 2072850 / 071 - 5145255 |

**ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරියෙන් ඔබට ලැබෙන ප්‍රතිලාභ**

- නිපුණතා පාදක පුහුණුව (CBT) යටතේ පාඨමාලා හැදෑරීම
- ජාතික වෘත්තීය සුදුසුකම් සහතිකය (NVQ) මට්ටම 03 හා 04 ලබා ගැනීමෙන් පසු ඩිප්ලෝමා හා තාක්ෂණ උපාධිය ලබාගැනීමේ අවස්ථාව
- තෝරාගත් පාඨමාලා සඳහා මාසික දීමනාවක්
- සහනදායී මුදලකට ලංගම ප්‍රවේශ පත්‍ර
- වෘත්තීය උපදේශන සේවාව හා වෘත්තීය ඉංග්‍රීසි දැනුම
- ව්‍යවසායකත්ව දැනුම
- ශිල්පීය ප්‍රවර්ධන දැනුම
- ජාතික හා ජාත්‍යන්තර වශයෙන් පිළිගත් සහතිකයක්
- මාසික දීමනාවක් සමඟින් වැඩිදුර පුහුණුව
- දේශීය / විදේශීය රැකියා සඳහා යොමු කිරීම
- ස්වයං රැකියා සඳහා යොමු කිරීම
- කුඩා හා මධ්‍යම පරිමාණ ව්‍යාපාර ආරම්භ කිරීමට අවශ්‍ය ව්‍යවසායකත්ව පුහුණුව සමග අඩු පොලී ණය පහසුකම් සඳහා යොමු කිරීම
- ව්‍යාපාර උපදේශන සේවා
- ක්ෂේත්‍රයේ ශිල්පීය නිපුණතාවය වර්ධනය කිරීමේ වැඩමුළු මගින් දැනුම යාවත්කාලීන කිරීම
- පාඨමාලා කාලය තුළ නොමිලේ ජීවිත රක්ෂණ ආවරණයක්

**ආදර්ශ අයදුම් පත්‍රය**

ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය

**2026 දෙවන අර්ධ වර්ෂය (ජූලි කණ්ඩායම) සඳහා ආධුනිකයන් බඳවා ගැනීම**

1. අයදුම්කරුගේ සම්පූර්ණ නම : ....................................................................................................
2. ලිපිනය : ......................................................................................
3. පදිංචිය : ......................................................................................
   (i.) ග්‍රාමසේවා වසම : ......................................................................
   (ii.) ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය : ......................................................
   (iii.) දිස්ත්‍රික්කය : ..............................................................................
4. දුරකතන අංකය : .............................................................................
5. උපන් දිනය : ................................................................
6. ජාතික හැඳුනුම්පත් අංකය : ...........................................................
7. ලබා ඇති ඉහළම අධ්‍යාපන සුදුසුකම : ..................................................................................

8. ඔබගේ රුචිකත්වය හා සුදුසුකම් අනුව හැදෑරීමට කැමති පාඨමාලා හා මධ්‍යස්ථාන අනුපිළිවෙලින් සඳහන් කරන්න -

| *පාඨමාලා කේතය (Course Code)* | *පාඨමාලාව* | *NVQ මට්ටම* | *අදාළ මධ්‍යස්ථානය* |
|---|---|---|---|
| | 1. | | 1. |
| | 2. | | 2. |
| | 3. | | 3. |

ඉහත තොරතුරු නිවැරදි හා සත්‍ය බවට සහතික කරමි.

.....................................
අයදුම්කරුගේ අත්සන

දිනය : ...................................

ඔබගේ අයදුම්පත පාඨමාලාව තෝරාගත් දිස්ත්‍රික්කයේ ආසන්නතම මධ්‍යස්ථානය වෙත ගොස් භාර දිය හැක. පාඨමාලා ආරම්භය **2026 ජූලි 01 වේ.**

**ශ්‍රී ලංකා වෘත්තිය පුහුණු අධිකාරිය**

**ආධුනිකයන් බඳවා ගැනීම - 2026 දෙවන අර්ධ වර්ෂය (ජූලි කණ්ඩායම)**

| *අ අ.* | *පාඨමාලා කේතය (Course Code)* | *වෘත්තිය පුහුණු ක්ෂේත්‍ර අනුව ක්‍රියාත්මක පාඨමාලා* | *NVQ Level 3* | *NVQ Level 4* |
|---|---|---|---|---|
| | | | *පාඨමාලා කාලය (මාස)* | |
| | | **Automobile Repair & Maintenance**<br>මෝටර් රථ අලුත්වැඩියාව සහ නඩත්තුව | | |
| 01 | HVO3 | National Certificate - Heavy Vehicle Operator (Fork Lift)<br>බර වාහන ක්‍රියාකරු (ෆෝක්ලිෆ්ට්) | 3 | |
| 02 | AEM 3 | National Certificate - Agricultural Machinery & Equipment Mechanic<br>කෘෂි යන්ත්‍ර සූත්‍ර සහ උපකරණ කාර්මික ශිල්පී - ජාතික සහතිකය | 12 | |
| 03 | AAM 3 | National Certificate - Automobile Air Conditioning Mechanic<br>මෝටර් රථ වායු සමීකරණ කාර්මික ශිල්පී - ජාතික සහතිකය | 6 | |
| 04 | AAT 4 | National Certificate - Automobile Air Conditioning Technician<br>මෝටර් රථ වායු සමීකරණ තාක්ෂණ ශිල්පී - ජාතික සහතිකය | | 12 |
| 05 | AE 3<br>AE 4 | National Certificate - Automobile Electrician<br>මෝටර් රථ විදුලි කාර්මික ශිල්පී - ජාතික සහතිකය | 6 | 12 |
| 06 | AM 4 | National Certificate - Automobile Mechanic<br>මෝටර් රථ කාර්මික ශිල්පී - ජාතික සහතිකය | 12 | 18 |
| 07 | AP 4 | National Certificate - Automobile Painter<br>මෝටර් රථ පින්තාරු ශිල්පී - ජාතික සහතිකය | 6 | 6 |
| 08 | AT 4 | National Certificate - Automobile Technician<br>මෝටර් රථ තාක්ෂණ ශිල්පී - ජාතික සහතිකය | | 18 |

| අ අ. | පාඨමාලා කේතය (Course Code) | වෘත්තීය පුහුණු ක්ෂේත්‍ර අනුව ක්‍රියාත්මක පාඨමාලා | NVQ Level 3 | NVQ Level 4 |
|---|---|---|---|---|
| | | | පාඨමාලා කාලය (මාස) | |
| 09 | ATi 3<br>ATi 4 | National Certificate - Automobile Tinker<br>මෝටර් රථ වැද්දුම් ශිල්පි - ජාතික සහතිකය | 6 | 6 |
| 10 | MCM 3 | National Certificate - Motorcycle Mechanic<br>යතුරු පැදි කාර්මික ශිල්පි - ජාතික සහතිකය | 6 | |
| 11 | MCT 4 | National Certificate - Motorcycle Technician<br>යතුරු පැදි තාක්ෂණ ශිල්පි - ජාතික සහතිකය | | 6 |
| 12 | TWM 3<br>TWM 4 | National Certificate – Three-Wheeler Mechanic<br>ත්‍රිරෝද රථ කාර්මික ශිල්පී - ජාතික සහතිකය | 6 | 6 |
| | | **Building & Construction**<br>**ගොඩනැගිලි සහ ඉදිකිරීම්** | | |
| 13 | ALN 3<br>AL 4 | National Certificate - Aluminium Fabricator<br>ඇලුමිනියම් පිරිසැකසුම් ශිල්පි - ජාතික සහතිකය | 3/6 | 6 |
| 14 | ALFID 4 | National Certificate - Aluminium Fabrication with Interior Decoration<br>ඇලුමිනියම් පිරිසැකසුම් සහ අභ්‍යන්තර අලංකරන ශිල්පි - ජාතික සහතිකය | | 12 |
| 15 | CCM 3<br>CCM 4 | National Certificate - Construction Craftsman (Masonry)<br>ඉදිකිරීම් ශිල්පි (පෙදරේරු) - ජාතික සහතිකය | 3/6 | 12 |
| 16 | DP 4 | National Certificate – Draughtsperson<br>සැලසුම් ශිල්පි - ජාතික සහතිකය | | 12 |
| 17 | LT 4 | National Certificate - Landscaping Technician<br>උද්‍යාන අලංකරන තාක්ෂණ ශිල්පි - ජාතික සහතිකය | | 6 |
| 18 | LDA 3 | National Certificate - Landscaping Development Assistant<br>උද්‍යාන සංවර්ධන සහකාර - ජාතික සහතිකය | 6 | |
| 19 | PL 3<br>PL 4 | National Certificate – Plumber<br>ජලනල කාර්මික ශිල්පි - ජාතික සහතිකය | 3/6 | 12 |
| 20 | QS 4 | National Certificate - Quantity Surveying Assistant<br>සහකාර ප්‍රමාණ සමීක්ෂක - ජාතික සහතිකය | | 6 |
| | | **Electrical, Electronic & Telecommunication**<br>**විදුලි, විද්‍යුත් සහ විදුලි සංදේශ** | | |
| 21 | MAW 3 | National Certificate - Electric Mechanic Winder<br>විදුලි මොටර් හා බල යන්ත්‍ර එතුම්කරු | | 6 |
| 22 | EAMT 4 | National Certificate - Electrical Appliance Maintenance Technician<br>විදුලි උපකරණ නඩත්තු තාක්ෂණ ශිල්පි - ජාතික සහතිකය | | 12 |
| 23 | EL 3<br>EL 4 | National Certificate – Electrician<br>විදුලි ශිල්පි - ජාතික සහතිකය | 6 | 12 |

| අ. අ. | පාඨමාලා කේතය (Course Code) | වෘත්තීය පුහුණු ක්ෂේත්‍ර අනුව ක්‍රියාත්මක පාඨමාලා | NVQ Level 3 | NVQ Level 4 |
|---|---|---|---|---|
| | | | පාඨමාලා කාලය (මාස) | |
| 24 | EAT 4 | National Certificate - Electronic Appliances Technician<br>විද්‍යුත් උපකරණ තාක්ෂණ ශිල්පි - ජාතික සහතිකය | | 12 |
| 25 | MPR 3 | National Certificate - Mobile Phone Repairer<br>ජංගම දුරකතන අලුත්වැඩියා කාර්මික ශිල්පි - ජාතික සහතිකය | 6 | |
| 26 | SPST 4 | National Certificate - Solar Photovoltaic Systems Technician<br>සූර්යබල පද්ධති තාක්ෂණ ශිල්පි - ජාතික සහතිකය | | 6 |
| 27 | PT 4 | National Certificate – Pneumatic Technician<br>වායුපීඩක තාක්ෂණ ශිල්පී - ජාතික සහතිකය | | 12 |
| | | **Food Technology**<br>**ආහාර තාක්ෂණය** | | |
| 28 | BAK 4 | National Certificate - Baker/ (Pastry & Bakery)<br>බේකරි ශිල්පි - ජාතික සහතිකය | | 6 |
| | | **Gem & Jewellery**<br>**මැණික් හා ස්වර්ණාභරණ** | | |
| 29 | JM 4 | National Certificate - Jewellery Maker (Goldsmith)<br>ස්වර්ණාභරණ (අත් නිමැවුම්) - ජාතික සහතිකය | | 12 |
| 30 | JSS 3 | National Certificate - Jewellery Stone Setter<br>ස්වර්ණාභරණ ගල් ඇල්ලීමේ ශිල්පි - ජාතික සහතිකය | 6 | |
| | | **Health and Social Work**<br>**සෞඛ්‍ය හා සමාජ** | | |
| 31 | CGEL 4 | National Certificate -Caregiver (Elderly Care)<br>සත්කාර සේවා වැඩිහිටි - ජාතික සහතිකය | | 6 |
| | | **Hotel & Tourism**<br>**හෝටල් සහ සංචාරක** | | |
| 32 | FBA 4 | National Certificate - Food & Beverage Associate<br>ආහාර පාන සහයක ශිල්පි- ජාතික සහතිකය | | 6 |
| 33 | GRO 4 | National Certificate - Guest Relation Officer<br>ආගන්තුක සම්බන්ධතා නිලධාරි - ජාතික සහතිකය | | 6 |
| 34 | FBA 3 | National Certificate – Assistant Food & Beverage Associate<br>ආහාර පාන සහයක ශිල්පි- ජාතික සහතිකය | 3 | |
| 35 | PC 4 | National Certificate - Professional Cookery<br>වෘත්තීය සූපවේදි - ජාතික සහතිකය | | 6 |
| 36 | RA 3 | National Certificate – House Keeping Services<br>කාමර සේවක සේවා ශිල්පි - ජාතික සහතිකය | | 6 |

| අ අ. | පාඨමාලා කේතය (Course Code) | වෘත්තිය පුහුණු ක්ෂේත්‍ර අනුව ක්‍රියාත්මක පාඨමාලා | NVQ Level 3 | NVQ Level 4 |
|---|---|---|---|---|
| | | | පාඨමාලා කාලය (මාස) | |
| | | **Information Communication & Multimedia Technology**<br>**තොරතුරු සන්නිවේදන හා බහුමාධ්‍ය තාක්ෂණය** | | |
| 37 | CHNT IT (A+) 4 | National Certificate – Computer Hardware & Network Technician with CISCO IT Essential ($A^+$) | | 12 |
| 38 | APCGD 4 | National Certificate – Adobe Certified Professional / Graphic Designer | | 6 |
| 39 | CGD 4 | National Certificate - Graphic Designer<br>චිත්‍රක ශිල්පි - ජාතික සහතිකය | | 6 |
| 40 | CHDHI 4 | National Certificate - Graphic Designer (Hearing Impaired)<br>චිත්‍රක ශිල්පි (ශ්‍රවණාබාධිත) - ජාතික සහතිකය | | 6 |
| 41 | CHT 4 | National Certificate - Computer Hardware Technician<br>පරිගණක දෘඩාංග ශිල්පි - ජාතික සහතිකය | | 6 |
| 42 | CHTC IT (A+) 4 | National Certificate - Computer Hardware Technician with CISCO IT Essential / A Puls | | 6 |
| 43 | NTC 4 | National Certificate – CISCO CCNA / Network Technician | | 1440Hrs |
| 44 | ICT 4 | National Certificate - Information and Communication Technology Technician<br>තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ශිල්පි - ජාතික සහතිකය | | 6 |
| 45 | ICT 3 | National Certificate – Computer Application Assistant<br>පරිගණක යෙදවුම් සහායක ශිල්පි - ජාතික සහතිකය | 4 | |
| 46 | | National Certificate – Computer Application Assistant (Disabled)<br>පරිගණක යෙදවුම් සහායක ශිල්පි - ජාතික සහතිකය | 12 | |
| 47 | MDA 4 | National Certificate - Multimedia Designing Associate<br>බහුමාධ්‍ය නිර්මාණ සහකරු - ජාතික සහතිකය | | 12 |
| 48 | SD 4 | National Certificate - Software Developer<br>මෘදුකාංග සංවර්ධක - ජාතික සහතිකය | | 12 |
| 49 | WD 4 | National Certificate - Web Developer | | 6 |
| | | **Leather & Footwear**<br>**සම් ආශ්‍රිත නිශ්පාදන** | | |
| 50 | LPC 3 | National Certificate - Leather Product Craftsman<br>සම්භාණ්ඩ ශිල්පි - ජාතික සහතිකය | 6 | |
| | | **Metal & Light Engineering**<br>**ලෝහ හා ලුහු ඉංජිනේරු** | | |
| 51 | FM 3<br>FM 4 | National Certificate - Fabricator (Metal)<br>ලෝහ පිරිසැකසුම්කරු - ජාතික සහතිකය | | 12 |

| අ අ. | පාඨමාලා කේතය (Course Code) | වෘත්තිය පුහුණු ක්ෂේත්‍ර අනුව ක්‍රියාත්මක පාඨමාලා | NVQ Level 3 | NVQ Level 4 |
|---|---|---|---|---|
| | | | පාඨමාලා කාලය (මාස) | |
| 52 | M-CML 4 | National Certificate - Machinist (CNC Milling & Lathe Operator)<br>යන්ත්‍ර ශිල්පි (CNC Milling & Lathe Operator) - ජාතික සහතිකය | | 6 |
| 53 | M-CM 4 | National Certificate - Machinist (CNC Milling Operator)<br>යන්ත්‍ර ශිල්පි (CNC Milling) - ජාතික සහතිකය | | 6 |
| 54 | M 3<br>M 4 | National Certificate - Machinist<br>යන්ත්‍ර ශිල්පි - ජාතික සහතිකය | 12 | 12 |
| 55 | WE 3<br>WE 4 | National Certificate – Welder<br>පෑස්සුම් ශිල්පි - ජාතික සහතිකය | 6 | 12 |
| 56 | WEGAM 4 | National Certificate - Welder (GAS/ARC/TIG/MAG)<br>පෑස්සුම් ශිල්පි (GAS/ARC/TIG/MAG) - ජාතික සහතිකය | | 12 |
| | | **Office Management**<br>**කාර්යාල කළමනාකරණය** | | |
| 57 | SEC 4 | National Certificate - Secretary (Secretarial Practice)<br>ලේකම් පරිචය - - ජාතික සහතිකය | | 12 |
| | | **Personal & Community Development**<br>**පුද්ගල හා සමාජ** | | |
| 58 | CHC 4 | National Certificate - Child Caregiver<br>ළමා සුරැකුම් - ජාතික සහතිකය | | 6 |
| 59 | BC 4 | National Certificate – Hair Dresser<br>කොණ්ඩා සැකසුම් ශිල්පි - ජාතික සහතිකය | | 4 |
| | | **Printing & Packaging**<br>**මුද්‍රණ සහ ඇසුරුම්** | | |
| 60 | OLMO 3 | National Certificate - Offset Machine Operator<br>ලිතෝ යන්ත්‍ර ක්‍රියාකරු - ජාතික සහතිකය | 6 | 6 |
| | | **Ref & Air-conditioning**<br>**ශීතකරණ හා වායු සමීකරණ** | | |
| 61 | RAM 3 | National Certificate - Refrigeration & Air-conditioning Mechanic<br>ශීතකරණ හා වායු සමීකරණ කාර්මික ශිල්පි - ජාතික සහතිකය | 12 | |
| 62 | RAT 4 | National Certificate - Refrigeration & Air-conditioning Technician<br>ශීතකරණ හා වායු සමීකරණ තාක්ෂණ ශිල්පි - ජාතික සහතිකය | | 12 |
| | | **Textile & Garment**<br>**රෙදිපිළි හා ඇඟලුම් ශිල්පි** | | |
| 63 | ADT 4 | National Certificate - Apparel Design Technician<br>ඇඟලුම් නිර්මාණ තාක්ෂණ ශිල්පි - ජාතික සහතිකය | | 12 |

| අ අ. | පාඨමාලා කේතය (Course Code) | වෘත්තිය පුහුණු ක්ෂේත්‍ර අනුව ක්‍රියාත්මක පාඨමාලා | NVQ Level 3 | NVQ Level 4 |
|---|---|---|---|---|
| | | | පාඨමාලා කාලය (මාස) | |
| 64 | BA 3 | National Certificate - Batik Artist<br>බතික් නිර්මාණ ශිල්පි - ජාතික සහතිකය | 6 | |
| 65 | DMT 3<br>DMT 4 | National Certificate - Dress Maker / Tailor<br>ඇඳුම් මැසීම - ජාතික සහතිකය | 6 | 6 |
| 66 | ISMM 3<br>ISMM 4 | National Certificate - Industrial Sewing Machine Mechanic<br>අධිවේගී මහන යන්ත්‍ර කාර්මික ශිල්පි - ජාතික සහතිකය | 6 | 6 |
| 67 | ISMO 3 | National Certificate - Industrial Sewing Machine Operator<br>අධිවේගී මහන යන්ත්‍ර ක්‍රියාකරු - ජාතික සහතිකය | 4 | |
| 68 | PM 4 | National Certificate - Pattern Maker<br>මෝස්තර නිර්මාණ ශිල්පි - ජාතික සහතිකය | | 6 |
| 69 | PSS 4 | National Certificate - Production Supervisor (Sewing)<br>නිෂ්පාදන සුපරීක්ෂක (මැහුම්) - ජාතික සහතිකය | | 6 |
| 70 | QAS 4 | National Certificate - Quality Assurance Supervisor (Apparel Production)<br>තත්ත්ව සහතික සුපරීක්ෂක (ඇඟළුම් නිෂ්පාදනය) - ජාතික සහතිකය | | 6 |
| 71 | SCR 3 | National Certificate - Screen Printer<br>තිර මුද්‍රණකරු - ජාතික සහතිකය | 6 | |
| 72 | TG 3<br>TG 4 | National Certificate - Tailor (Gents)<br>ඇඳුම් මැසීම (පිරිමි) - ජාතික සහතිකය | 6 | 6 |
| 73 | IEO 4 | National Certificate - Industrial Engineering Officer<br>(Work-Study) | | 6 |
| | | **Wood Related**<br>**දැව ආශ්‍රිත** | | |
| 74 | WCA 3 | National Certificate - Wood Carving Artist<br>ලී කැටයම් ශිල්පි - ජාතික සහතිකය | 6 | 6 |
| 75 | WCB 3 | National Certificate - Wood Craftsman (Building)<br>දැව තාක්ෂණ ශිල්පි (ගොඩනැගිලි) - ජාතික සහතිකය | 6 | 12 |
| 76 | WCBAL 3<br>WCBAL 4 | National Certificate - Wood Craftsman (Building) with relevant<br>Aluminum Modules | 6 | 12 |
| 77 | WCF 3<br>WCF 4 | National Certificate - Wood Craftsman (Furniture)<br>දැව තාක්ෂණ කාර්මික ශිල්පි (ගෘහ භාණ්ඩ) - ජාතික සහතිකය | 3/6 | 12 |
| 78 | WCFAL 3<br>WCFAL 4 | National Certificate - Wood Craftsman (Furniture) with relevant<br>Aluminum Modules | 6 | 12 |

| අ අ. | පාඨමාලා කේතය (Course Code) | ඩිප්ලෝමා පාඨමාලා **Diploma Course** | NVQ Level 5 (පාඨමාලා කාලය) |
|---|---|---|---|
| 79 | COSM 5 | National Diploma - Cosmetology | 840Hrs |
| 80 | QS 5 | National Diploma - Quantity Surveying<br>ප්‍රමාණ සමීක්ෂක - ජාතික ඩිප්ලෝමාව | 12 |
| 81 | ICT 5 | National Diploma -Information and Communication Technology NVQ Level 05<br>තොරතුරු හා සංනිවේදන තාක්ෂණය - ජාතික ඩිප්ලෝමාව | 12 |
| 82 | | National Diploma – Automobile Technology<br>මෝටර් රථ තාක්ෂණ ශිල්පී - ජාතික ඩිප්ලෝමාව | 18 |
| 83 | RT 6 | National Diploma – Automation and Robotic Technology<br>රොබෝ තාක්ෂණය - ජාතික ඩිප්ලෝමාව | 30 |
| 84 | EL 5 | National Diploma – Electrical Technology<br>විදුලි තාක්ෂණ - ජාතික ඩිප්ලෝමාව | 18 |
| 85 | ELT 6 | National Diploma – Electronic Technology<br>විද්‍යුත් තාක්ෂණ - ජාතික ඩිප්ලෝමාව | 30 |
| 86 | FPT 5 | National Diploma – Fluid Power Technology (Hydraulic & Pneumatic)<br>ද්‍රව බලශක්ති තාක්ෂණ - ජාතික ඩිප්ලෝමාව | 18 |
| 87 | MT 5 | National Diploma – Mechatronics Technology<br>මෙකාට්‍රොනික් තාක්ෂණ - ජාතික ඩිප්ලෝමාව | 18 |
| 88 | CNC 5 | National Diploma – Computer Numerically Controlled Manufacturing Technology (CNC Technology)<br>CNC තාක්ෂණ - ජාතික ඩිප්ලෝමාව | 18 |
| 89 | WT 5 | National Diploma – Welding Technology<br>පෑස්සුම් තාක්ෂණ - ජාතික ඩිප්ලෝමාව | 18 |
| 90 | RACT 5 | National Diploma – Refrigeration and Air Conditioning Technology<br>ශීතකරණ හා වායුසමීකරණ - ජාතික ඩිප්ලෝමාව | 18 |
| | | **වෙනත්**<br>**Others** | |
| 91 | DIPIM | Diploma in Industrial Management<br>කාර්මික කළමණාකරණ ඩිප්ලෝමාව | |
| 92 | LO (SK) | Logistics Operations (Store Keeper) | 6 |
| 93 | LT (WC) | Logistic Technician (Wharf Clerk) | 6 |

06 - 108